කාර්යසාධන වාර්තාව 2025

වැය ශීර්ෂ අංකය - 238

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ 01

පටුන

1.0 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 01

1.1 හැඳින්වීම 02

1.2 දැක්ම හා මෙහෙවර 02

1.3 අරමුණු හා කාර්යයන්..02

1.4 සංවිධාන සටහන..04

2.0 ප්‍රගතිය, අභියෝග හා ඉලක්ක 05

2.1 සමාලෝචනය 06

2.2 බදු ප්‍රතිපත්ති සංස්කරණය 07

2.3 රාජ්‍ය ආදායම් කාර්යසාධනය 08

2.4 අභියෝග හා අනාගත ඉලක්ක.. 34

3.0 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍යකාර්ය සාධනය.........35

3.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය..36

3.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 37

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය..38

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 39

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 40

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 40

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදනය කරන ලද ප්‍රතිපාදන 40

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය..41

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 2025 42

4.0 කාර්ය සාධන දර්ශක 48

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 49

5.0 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ කාර්යසාධනය 52

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු..53

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 53

6.0 මානව සම්පත් පැතිකඩ.. 54

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 55

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන්. 55

6.3 මානව සම්පත් සංවර්ධනය 55

7.0 අනුකූලතා වාර්තාව.. 62

01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.0 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වනුයේ අපේක්ෂිත ආර්ථික හා සාමාජයීය අභිමථාර්තයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අදාළ ආයතන, රේඛීය අමාත්‍යාංශ සහ පෞද්ගලික අංශය සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි.

1.2 දැක්ම හා මෙහෙවර

දැක්ම

''තිරසර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ස්ථාපිත වීම සහතික කිරීම''

මෙහෙවර

''රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම''

1.3 අරමුණු හා කාර්යයන්

අරමුණු:

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම- රජයේ පුළුල් ආර්ථික සංවර්ධන අරමුණු සමඟ සමපාත වන ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සැලසුම් කිරීම ප්‍රධාන අරමුණකි.

- තිරසාර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුවක් සහතික කිරීම- අධික මූල්‍ය හිඟයන් හෝ දරාගත නොහැකි රාජ්‍ය ණය මට්ටම් වළක්වා ගනිමින්, දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වයක් ඇති කරන රාජ්‍ය මූල්‍ය රාමුවක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම.

- මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය උපාය මාර්ග සකස් කිරීම- පුළුල් සාර්ව ආර්ථික අරමුණු ඒකාබද්ධ කරමින් අයවැය හිඟ සීමාවන්, ණය අනුපාත සහ ආදායම් ඉලක්ක වැනි දර්ශක ඇතුළත් මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය උපාය මාර්ග ප්‍රකාශන සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ලේඛන සකස් කිරීම.

- රාජ්‍ය ආයතන සහ බාහිර පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය- රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගවල සහ සම්බන්ධතාවය සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය ආයතන සමඟ සමීපව කටයුතු කරයි.

- ආදායම්, වියදම් සහ සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය කිරීම- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති නිවැරදිව සකස් කිරීමට, බදු ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීමට සහ රජයේ අනාගත රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් පුරෝකථනය කිරීමට ජාතික ආදායම් මාර්ග, වියදම් රටාවන් මෙන්ම දේශීය හා ගෝලීය ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය කිරීම.

- බදු ප්‍රතිපත්ති සමාලෝචනය සහ සංශෝධනය - ආදායම් උපයෝගිතාව ඉහළ නැංවීම සහ බදු ක්‍රමයේ සාධාරණත්වය හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා බදු පදනම පුළුල් කිරීම හෝ බදු අනුපාත සකස් කිරීම වැනි බදු ප්‍රතිපත්තිමය වෙනස්කම් සැකසීම.

- රාජ්‍ය මූල්‍ය තිරසාර නීති සඳහා ප්‍රතිපත්තිමය සහාය ලබාදීම- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත වැනි නීතිමය රාමු සහ අයවැය හිඟය පාලනය කිරීම හා ණය තිරසාරභාවය සහතික කිරීම අරමුණු කරගත් මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක සමඟ මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු සමපාත වේ.

කාර්යයන්:

- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය උපාය මාර්ග සැකසීම සහ ක්‍රියාත්මක කිරීම- රාජ්‍ය පෞද්ගලික සහ ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය උපාය මාර්ග සම්පාදනය කිරීම සහ බලාත්මක කිරීම.

- බදු ප්‍රතිපත්ති සහ අදාළ ව්‍යවස්ථාපිත රීති සැකසීම- රේගු ගාස්තු සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු හැර අනෙකුත් බදු ප්‍රතිපත්ති සහ ඒ හා සම්බන්ධ ව්‍යවස්ථාපිත නීති රීති සම්පාදනය කිරීම.

- රාජ්‍ය මූල්‍ය ප්‍රතිඵල සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය කළමනාකරණය හා සමාලෝචනය- රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වයේ අවසාන ප්‍රතිඵල හා කාර්යසාධනය කළමනාකරණය කිරීම සහ නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.

- ආදායම් එකතු කිරීමේ සහ අයවැය ක්‍රියාත්මක කිරීමේ ආයතන සමඟ සම්බන්ධීකරණය- ආදායම් එකතු කිරීමේ නියැලී සිටින සියලුම දෙපාර්තමේන්තු, ජාතික අයවැය සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාත්මක කිරීමේ අංශ සමඟ නිසි සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.

- ප්‍රතිපත්තිමය තීරණ අනුව අණ පණත් සංශෝධන කටයුතු සිදුකිරීම- රජය වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුව ආදායම් සම්බන්ධ අණ පණත් සංශෝධනය කිරීමේ කටයුතු මෙහෙයවීම.

- 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම

- සාර්ව රාජ්‍ය මූල්‍ය ඒකකයේ හා බදු ප්‍රතිපත්ති විශ්ලේෂණ ඒකකයේ සහාය ඇතිව විශ්ලේෂණ සහ පර්යේෂණ සිදුකිරීම- සාර්ව රාජ්‍ය මූල්‍ය ඒකකයේ සහාය ලබා ගනිමින් විවිධ රාජ්‍ය මූල්‍ය සහ සාර්ව ආර්ථික කරුණු පිළිබඳව විශ්ලේෂණ හා පර්යේෂණ සිදුකිරීම.

- බදු ප්‍රතිපත්ති ඒකකය මගින් බදු ප්‍රතිපත්තිය ස්ථාවරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කෙටුම්පත් හා ගැසට් නිවේදන සැකසීම, අදාල බදු නිදහස් කිරීම්/සහන ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම හා ඒ පිළිබඳ නියෝජනයන් කිරීම.

- අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සහ ගැසට් පත්‍ර සකස් කිරීම- අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම, අදාළ පනත් සංශෝධනය කිරීම සහ අවශ්‍ය ගැසට් නිවේදන සකස් කිරීම.

- ශ්‍රී ලංකාව තුල ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබන වැඩසටහන් සම්බන්ධීකරණය කරනු ලබන ආයතනය ලෙස කටයුතු කිරීම.

1.4 සංවිධාන සටහන



අතිරේක අ.ජ.	-	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
නි.අ.	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අ.	-	සහකාර අධ්‍යක්ෂ
ප.නි.	-	පරිපාලන නිලධාරී
භාෂා. පරි.	-	භාෂා පරිවර්තක
සං.නි.	-	සංවර්ධන නිලධාරී
ප්‍ර.ක.සේ.නි.	-	ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ක.සේ.නි.	-	කළමනාකරණ සේවා නිලධාරී
කා.සේ.සේ.	-	කාර්යාල කාර්ය සහායක

02

ප්‍රගතිය, අභියෝග සහ ඉලක්ක

2.1 සමාලෝචනය

2025 වසරේ දී, තීරණාත්මක රාජ්‍ය මූල්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නංවමින් රජය විසින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය අඛණ්ඩව ඉදිරියට ගෙන යන ලදී. මෝටර් රථ ආනයන බදු, දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බදු, විදේශීය වෙළඳාම මත බදු යනාදියෙන් ඉහළ ආදායමක් ලැබීම සහ ප්‍රාග්ධන වියදම් දැරීම මන්දගාමීව සිදුවීම හේතුවෙන්, රජයේ ආදායම සහ අයවැය ශේෂයන් අපේක්ෂිත අයවැය ඉලක්ක ඉක්මවා යන ලදී.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ තුළින් අසීරුතා මධ්‍යයේ අත්පත් කරගත් ජයග්‍රහණ මඟින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් වී ඇති අතර, එය පහත දැක්වෙන මූලික ප්‍රතිඵල ලඟාකර ගැනීම තුළින් පිළිඹිබු වේ:

(i) ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායම, 2022 වසරේ වූ සියයට 7.3 සිට 2025 වසරේ දී සියයට 15.4 දක්වා ඉහළ යාම - එය 1997 වසරෙන් පසු වාර්තා වූ ඉහළම අගය වේ;

(ii) 2022 වසරේ වූ සියයට 3.7 ක ප්‍රාථමික හිඟයට සාපේක්ෂව, 2025 වසරේ දී සියයට 5.4 ක ප්‍රාථමික අතිරික්තයක් ලඟාකර ගැනීම;

(iii) මෙරට ඉතිහාසයේ ප්‍රථම වතාවට, 2025 වසරේ දී වර්තන ගිණුමේ අතිරික්තය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 0.7 ක් ලෙස වාර්තා වීම; සහ

(iv) 2022 වසරේ දී ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 10.2 ක් ව පැවති අයවැය හිඟය 2025 වසරේදී සියයට 2.3 දක්වා අඩු වීම.

ප්‍රදාන ද ඇතුළුව රජයේ ආදායම නාමික වශයෙන් 2024 වසරේ දී වූ රු.බිලියන 4,090.8 සිට 2025 වසරේ දී රු. බිලියන 5,485.6 ක් දක්වා සියයට 34.1 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම ඉහළ යෑම මෙසේ රජයේ සමස්ත ආදායම සැලකිය යුතු ලෙස වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 1,309.7 සිට 2025 වසරේ දී රු. බිලියන 1,746.9 ක් දක්වා සියයට 33.4 කින් වර්ධනය විය. දේශීය පරිභෝජනය ඉහළ යාම, බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය වැඩි වීම, මූල්‍ය සේවා මත වන එකතු කළ අගය මත බදු ආදායම ඉහළ යාම සහ එකතු කළ අගය මත බදු ජාලයට මෝටර් රථ ඇතුලත් කිරීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

නිෂ්පාදන/ සුරා බද්දෙන් ද 2025 වසරේ සමස්ත ආදායම් කාර්යසාධනය සඳහා ප්‍රධාන දායකත්වයක් ලබා දී ඇත. දුම්වැටි මත නිෂ්පාදන බද්දෙන් හැර, නිෂ්පාදන බද්දට යටත් අනෙකුත් සියළුම උප කාණ්ඩවලින් ලද නිෂ්පාදන/සුරා බදු ආදායම වසර තුළ ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. විශේෂයෙන්ම, 2020 වසරේ සිට තාවකාලිකව පනවා තිබූ වාහන ආනයන සීමා ලිහිල් කිරීමත් සමඟ මෝටර් රථ මත නිෂ්පාදන බදු ආදායම 2025 වසර සඳහා වූ වාර්ෂික ඉලක්කය මෙන් දෙගුණයකට වඩා වැඩි විය. 2025 වසරේ පෙබරවාරි මාසයේ දී වාහන ආනයනය නැවත ආරම්භ කිරීමත් සමඟ, මෝටර් රථ මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 58.6 සිට 2025 වසරේ දී රු. බිලියන 471.8 දක්වා රු. බිලියන 413.2 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. ඛනිජ තෙල් මත වූ නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 200.2 සිට 2025 වසරේ දී රු. බිලියන 240.6 දක්වා සියයට 20.2 කින් ඉහළ ගිය අතර, මත්පැන්වලින් ලද සුරා බදු ආදයම, 2024 වසරේ දී වූ රු. බිලියන 213.4 සිට 2025 වසරේ දී රු. බිලියන 231.5 දක්වා සියයට 8.5 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, දුම්වැටි මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 118.3 සිට 2025 වසරේ දී රු. බිලියන 102.7 දක්වා සියයට 13.2 කින් පහත වැටුණි.

ආදායම් බද්දෙන් ලද ආදායම, 2024 වසරේ දී වූ රු. බිලියන 1,026.2 සිට 2025 වසරේ දී රු. බිලියන 1,139.4 දක්වා ළඟා වෙමින්, අඛණ්ඩව දෙවන වසරටත් රු. ට්‍රිලියනයේ සීමාව ඉක්මවා යන ලදී. මෙය පසුගිය වසරට සාපේක්ෂව සියයට 11.0 ක වර්ධනයක් සහ 2025 වසර සඳහා වූ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 97.6 ක ළඟා කර ගැනීමකි. මත්පැන්, දුම්කොළ සහ ඔට්ටු හා සූදු කර්මාන්ත සඳහා අදාළ වන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ නැංවීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නාමික වැටුප් ඉහළ යාම තුලින් බදු පදනම පුළුල් වීම සහ ඩිජිටල් ආර්ථිකයේ වර්ධනය තුලින් උපයන ආදායම් උකහා ගැනීම සඳහා සේවා අපනයන මත සියයට 15 ක ආදායම් බද්දක් හඳුන්වාදීම මෙම ඉහළ කාර්යසාධනය සඳහා හේතු විය. වාර්ෂික ආදායම් ඉලක්කයෙන් සියයට 97.6 ක් ළඟා කර ගැනීම තුලින් බදු පරිපාලනයේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීම සහ බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය සමස්තයක් ලෙස ශක්තිමත් වීම පිළිඹිබු කරයි.

එලෙසම, සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 250.9 සිට 2025 වසරේ දී රු. බිලියන 294.5 දක්වා සියයට 17.4 කින් වර්ධනය වූ අතර, එය 2025 වසර සඳහා වූ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 111.6 ක ළඟා කර ගැනීමකි. මෙම වර්ධනය සඳහා 2024 වසරේ ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වාර්ෂිකව රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීමේ සමස්ත වාර්ෂික බලපෑම හේතු විය.

වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන්, විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, රේගු ආනයන බද්දෙන් සහ සෙස් බද්දෙන් ලද ආදායම් වර්ධනය වීමෙන් විදේශීය වෙළඳාම මත බදු ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 477.5 සිට 2025 වසරේ දී රු. බිලියන 711.7 දක්වා සියයට 49.1 කින් වැඩි විය. රේගු ආනයන බදු ආදායම, 2024 වසරේ දී වූ රු. බිලියන 111.1 ට සාපේක්ෂව 2025 වසරේ දී රු. බිලියන 275.9 දක්වා සියයට 148.2 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වීමට මෙම වසර තුළ මෝටර් රථ ආනයනය මත රේගු ආනයන බදු පැනවීම හේතු විය. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 115.2 සිට 2025 වසරේ දී රු. බිලියන 164.6 දක්වා සියයට 42.9 ක වර්ධනයක් වාර්තා කරමින් 2025 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව සියයට 30.6 කින් ඉක්මවා යන ලදී. සීනි, ලොකු ලූණු සහ අර්තාපල් මත පැනවෙන බදු අනුපාත ඉහළ දැමීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

බදු නොවන මූලාශ්‍රවලින් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 326.3 සිට 2025 වසරේ දී රු. බිලියන 400.2 දක්වා සියයට 22.7 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් විකුණුම් සහ ගාස්තු, පොලී/කුලී සහ සමාජ ආරක්ෂණ දායක මුදල් මඟින් ලද ආදායම් වැඩි වීම හේතු විය.

රාජ්‍ය ආදායම් සාරාංශය

රු. මිලියන

අයිතමය	2022	2023	2024	2025 [illegible]
මුළු ආදායම් සහ ප්‍රදාන	**2,012,589**	**3,074,324**	**4,090,808**	**5,485,552**
මුළු ආදායම	**1,979,184**	**3,048,822**	**4,030,838**	**5,449,402**
බදු ආදායම	1,751,132	2,720,563	3,704,577	5,049,192
ආදායම් බදු	534,021	911,355	1,026,199	1,139,373
භාණ්ඩ හා සේවා මත බදු	875,995	1,420,089	2,200,890	3,198,100
විදේශ වෙළෙඳාම මත බදු	341,116	389,118	477,488	711,718
බදු නොවන ආදායම	228,052	328,259	326,261	400,210
ප්‍රදාන	**33,405**	**25,502**	**59,970**	**36,150**
ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස				
මුළු ආදායම් සහ ප්‍රදාන	**8.4**	**11.2**	**13.6**	**16.7**
මුළු ආදායම	**8.2**	**11.1**	**13.4**	**16.6**
බදු ආදායම	7.3	9.9	12.3	15.4
බදු නොවන ආදායම	0.9	1.2	1.1	1.2
ප්‍රදාන	0.1	0.1	0.2	0.1

2.2 බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

2025 වසරේ දී ශ්‍රී ලංකාව අනපේක්ෂිත අයුරින් විදේශීය කම්පනයන්ට මුහුණදෙමින් ව්‍යුහාත්මක අසමතුලිතතා නිවැරදි කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය අඛණ්ඩව පවත්වා ගෙන ඇත. නවීකරණය කරන ලද බදු පරිපාලන ක්‍රියාවලියක් හරහා බදු පදනම පුළුල් කරමින්, මහජනයාට ඉලක්කගත සහන සැලසීමේ සියුම් තුලනාත්මක ක්‍රියාවලියකින් සමන්විත විය.

2025 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට පුද්ගල ආදායම් බදු ගෙවන්නන්ට සහන සැලසීමේ අරමුණින් පුද්ගල ආදායම් බදු සීමාවන් සහ අනුපාත සංශෝධනය කිරීම ඇතුළත් වේ. ඒ අනුව, 2025 වසරේ අප්‍රේල් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පුද්ගල ආදායම් බදු නිදහස් සීමාව, වසරකට රු. 1,200,000 ක සිට රු.

1,800,000 ක් දක්වා ඉහළ නංවන ලදී. ඒ හා සමගාමීව, මත්පැන්, දුම්කොළ සහ ඔට්ටු හා සූදු කර්මාන්ත සඳහා අදාළ වන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ නංවන ලදී. මීට අමතරව, විදේශීය සේවාලාභීන්ට සපයන වෘත්තීය සේවා සහ අනෙකුත් විදේශීය ආදායම් යන දෙයාකාරයෙන්ම උපයනු ලබන සහ බලපත්‍රලාභී බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට එවනු ලබන විදේශ ව්‍යවහාර මුදලින් උපයන ආදායම් මත සියයට 15 ක නව සංස්ථාපිත ආදායම් බද්දක් හඳුන්වා දෙන ලදී.

2025 වසරේ, ඉහත හඳුන්වා දෙන ලද ආදායම් බදු ක්‍රියාමාර්ගවලට අමතරව, එකතු කළ අගය මත බද්ද, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සහ නිෂ්පාදන/සුරා බද්ද සඳහා ද ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී. 2025 වසරේ ඔක්තෝබර් මස 01 වැනි දින සිට සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය අවලංගු කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ප්‍රධාන ව්‍යුහාත්මක මිණුම් දණ්ඩක් වන මෙම ප්‍රතිසංස්කරණය හරහා ආදායම් කාන්දුවීම් සහ පරිපාලනමය සංකීර්ණතා අවම කිරීම අරමුණු කරයි. මෙම සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය වෙනුවට නව, අවදානම් පාදක ආපසු ගෙවීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.

අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද/රඳවා තබාගැනීමේ බද්ද

භාණ්ඩය	අනුපාතය (%)	අවසානාත්මක/ අවසානාත්මක නොවන
ලාභාංශ	15	අවසානාත්මක
පොලී හෝ ගෙවනු ලබන වට්ටම්	10	අවසානාත්මක නොවන
මසකට රු.100,000 ඉක්මවන කුලී ගෙවීම්	10	අවසානාත්මක නොවන
වෘත්තිකයන් වැනි පුද්ගලයන්ට ගෙවනු ලබන මසකට රු.100,000 ඉක්මවන සේවා ගෙවීම්	5	අවසානාත්මක නොවන
වෙනත් සියළුම අවස්ථා	14	අවසානාත්මක නොවන
අනේවාසික	14	අවසානාත්මක නොවන

2024 වසරේ දී අඩු කරන ලද සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා වන ලියාපදිංචි වීමේ සීමාව 2026 වසරේ ජූලි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වසරකට රු. මිලියන 60 සිට රු. මිලියන 36 දක්වා තවදුරටත් අඩු කරනු ඇත. මෙම ක්‍රියාමාර්ගය තුළින් බදු ගෙවීමට යටත් වන ආයතන සංඛ්‍යාව වැඩි කිරීම සහ ආදායම් විභවතාවය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

2024 වසරේදී ප්‍රථම වරට හඳුන්වා දුන් වාර්ෂික උද්ධමනයට ගැළපුම්ගත කරමින් දර්ශකකරණ ක්‍රමවේදය මත පදනම්ව ඒකක අනුපාත සහිත නිෂ්පාදන/සුරා බදු අය කළ හැකි සියලුම භාණ්ඩ සඳහා නිෂ්පාදන/සුරා බද්ද 2025 වසරේ දී සියයට 5.9 කින් වැඩි කරන ලදී. මීට අමතරව 2025 වසරේ පෙබරවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි විද්‍යුත් වාහන මත නිෂ්පාදන බද්ද සියයට 100 කින් ඉහළ නංවන ලදී.

නොවැම්බර් මස අග භාගයේදී ඇති වූ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් 2026 අයවැය සඳහා රු. බිලියන 500 ක පරිපූරක ඇස්තමේන්තුවක් ඇතුළුව, කඩිනමින් යථා තත්ත්වයට පත්වීම සඳහා ප්‍රතිපාදන නැවත වෙන් කිරීමට සිදු වුව ද, 2025 වසරේ ආදායම් කාර්යසාධනය තුළින් අත්කරගත් ශක්තිමත් අඩිතාලම හේතුවෙන් ශ්‍රී ලංකාවේ දිගුකාලීන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ඉලක්කයන්ට හානියක් නොවන පරිදි ඉහත රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග තිරසාරව ක්‍රියාත්මක කිරීමට හැකි විය.

2.3 රජයේ ආදායම් කාර්යසාධනය

2025 වසරේ දී ප්‍රදාන ඇතුළුව රජයේ සමස්ත ආදායම, 2024 වසරේ දී වූ රු. බිලියන 4,090.8 ට සාපේක්ෂව රු. බිලියන 5,485.6 දක්වා සියයට 34.1 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, එය අයවැය ඇස්තමේන්තුව ප්‍රතිශතාංක 9.9 කින් ඉක්මවා යාමකි. ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස, ප්‍රදාන ඇතුළුව ආදායම 2024 වසරේ දී වූ සියයට 13.6 ට සාපේක්ෂව 2025 වසරේ දී සියයට 16.7 දක්වා ප්‍රතිශතාංක 3.2 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් මෝටර් රථ ආනයන සීමා ඉවත් කිරීමත් සමඟ එකතු වූ ඉහළ බදු ආදායම සහ දේශීය ක්‍රියාකාරකම් මත පැනවූ එකතු කළ අගය මත බදු ආදායම ඉහළ යාමෙන් බදු ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 3,704.6 සිට 2025 වසරේ දී රු. බිලියන 5,049.2 දක්වා සියයට 36.3 කින් වර්ධනය වීම මේ සඳහා සැලකිය යුතු ලෙස දායක විය.

1997 වසරෙන් පසු වාර්තා වූ ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායමේ ඉහළම අගය සනිටුහන් කරමින් 2025 වසරේ දී ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායම සියයට 15.4 ක් දක්වා වර්ධනය වූ අතර, එය පසුගිය වසරේ දී වාර්තා වූ සියයට 12.3 ට සාපේක්ෂව ප්‍රතිශතාංක 3.1 ක කැපී පෙනෙන වර්ධනයකි. සමස්ත බදු ආදායමට වැඩිම දායකත්වයක් සපයන එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම, 2024 වසරේ දී වූ රු. බිලියන 1,309.7 ට සාපේක්ෂව 2025 වසරේ දී රු. බිලියන 1,746.9 දක්වා සියයට 33.4 කින් වර්ධනය වී ඇත. ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස එකතු කළ අගය මත බදු ආදායම 2025 වසරේ දී ප්‍රතිශතාංක 1.0 කින්

සියයට 5.3 දක්වා වර්ධනය වී ඇත. මෙම ඉහළ කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමට සමගාමීව ආනයනවලින්, විශේෂයෙන්ම මෝටර් රථ ආනයනයෙන් ලැබුණු ඉහළ ආදායම හේතු විය. ඒ අනුව, 2025 වසරේ දී ආනයන මඟින් ලද එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 891.4 දක්වා සියයට 49.2 කින් වර්ධනය වී ඇති අතර, දේශීය ක්‍රියාකාරකම් මඟින් ලද එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 855.5 දක්වා සියයට 20.1 කින් වර්ධනය වී ඇත. නිෂ්පාදන බදු, එකතු කළ අගය මත බදු, රේගු ආනයන බදු සහ සුඛෝපභෝගී මෝටර් රථ බදු ඇතුළු මෝටර් රථ සඳහා වන බදුවලින් ලැබුණු ආදායම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.8 ක් දක්වා වර්ධනය වී ඇත.

2025 වසරේ දී ආදායම් බද්දෙන් ලද ආදායම රු. බිලියන 1,139.4 ක් වූ අතර එය 2024 වසරේ දී වූ රු. බිලියන 1,026.2 ට සාපේක්ෂව සියයට 11.0 කින් වර්ධනය වී ඇත. 2025 වසරේ දී හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලද ආදායම් රැස්කිරීමේ ක්‍රියාමාර්ග රාශියක් ආදායම් බද්දෙන් ලද ආදායමෙහි වර්ධනය සඳහා ධනාත්මකව දායක වී ඇත. මෙම ආදායම් රැස්කිරීමේ ක්‍රියාමාර්ග අතර (i) මත්පැන්, දුම්කොළ, සහ ඔට්ටු ඇල්ලීම් හා සූදු කර්මාන්ත සඳහා වූ සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 40 සිට සියයට 45 දක්වා සංශෝධනය කිරීම; (ii) සේවා අපනයනය මත සියයට 15 ක ආදායම් බද්දක් හඳුන්වා දීම; (iii) පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු අනුපාතිකය සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ නැංවීම; සහ (iv) බදු පරිපාලනයේ සිදු වූ ප්‍රගතිය පිළිබිඹු කරමින්, ලියාපදිංචි ආදායම් බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව 2024 වසරේ සිට 2025 වසර වන විට බදු ගොනු 1,302,596 දක්වා සියයට 19.2 කින් ඉහළ යාම වේ.

මෝටර් රථ ආනයනයෙන් ලැබුණු ඉහළ ආදායම සහ වාර්ෂික උද්ධමනයට ගැළපුම්ගත කරමින් දර්ශකකරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමෙන් පසු නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ මත නිෂ්පාදන බදු අනුපාතික ඉහළ දැමීම හේතුවෙන් 2025 වසරේ දී ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස නිෂ්පාදන/ සුරා බදු ආදායම, 2024 වසරේ දී වූ සියයට 2.0 ට සාපේක්ෂව සියයට 3.2 දක්වා ප්‍රතිශතාංක 1.2 කින් වර්ධනය වී ඇත. දුම්වැටි මඟින් ලද නිෂ්පාදන බදු ආදායමේ අඩු වීමක් සිදු වුව ද, මත්පැන්, ඛනිජ තෙල් සහ අනෙකුත් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවලින් ලැබුණු බදු ආදායම සමස්ත ආදායම් වර්ධනය සඳහා ධනාත්මකව දායක විය.

2025 වසරේ දී රේගු ආනයන බදු ආදායම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 0.8 ක් දක්වා ප්‍රතිශතාංක 0.5 කින් වර්ධනය වී ඇති අතර මේ සඳහා ප්‍රධාන වශයෙන්ම මෝටර් රථ ආනයනයෙන් ලැබුණු බදු අදායම ඉහළ යාම හේතු විය.

රාජ්‍ය ආදායම

(රුපියල් බිලියන)



බදු ආදායමේ සංයුතිය



නාමික වශයෙන්, 2024 වසරේ දී රු. බිලියන 111.1 ක් වූ රේගු ආනයන බදු ආදායම, 2025 වසරේ දී රු. බිලියන 275.9 දක්වා සියයට 148.2 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මීට අමතරව, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද රු. බිලියන 294.5 ක් දක්වා සියයට 17.4 කින් වැඩි වීම, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. බිලියන 164.6 ක් දක්වා සියයට 29.9 කින් වැඩි වීම, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද රු. බිලියන 180.9 ක් දක්වා සියයට 6.4 කින් වැඩි වීම, සෙස් බද්ද රු. බිලියන 90.4 ක් දක්වා සියයට 11.4 වැඩි වීම සමස්ත බදු ආදායමේ කාර්යසාධනය සඳහා ධනාත්මකව දායක විය.

රු. මිලියන

අයිතමය	ආදායම් ඇස්තමේන්තුව	තාවකාලික	අපගමනය
මුළු ආදායම	**4,960,000**	**5,449,402**	**489,402**
බදු ආදායම	**4,590,000**	**5,049,192**	**459,192**
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව			
ආදායම් සහ ලාභ මත බදු	1,167,000	1,139,373	-27,627
එකතු කළ අගය මත බදු - දේශීය (ශුද්ධ)	825,000	855,485	30,485
ජාතික ගොඩනැගීමේ බදු (දේශීය)	-	81	81
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (දේශීය)	190,000	221,906	31,906
වෙනත්	13,220	17,797	4,577
මුළු උප එකතුව	**2,195,220**	**2,234,641**	**39,421**
රේගු දෙපාර්තමේන්තුව			
ආනයන බදු	240,000	275,894	35,894
එකතු කළ අගය මත බදු - ආනයන (ශුද්ධ)	790,000	891,390	101,390
ජාතික ගොඩනැගීමේ බදු (ආනයන)	-	407	407
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (ආනයන)	74,000	72,614	-1,386
වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු	185,000	180,853	-4,147
සෙස් බදු	100,000	90,373	-9,627
විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු	126,000	164,599	38,599
නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)			
දුම්වැටි	130,000	101,173	-28,827
ඛනිජ තෙල්	230,000	240,575	10,575
මෝටර් වාහන සහ අනෙකුත්	239,000	483,872	244,872
වෙනත්	1,032	2,278	1,246
මුළු උප එකතුව	**2,115,032**	**2,504,027**	**388,995**
සුරාබදු දෙපාර්තමේන්තුව			
මත්පැන් /දුම්කොළ	242,000	233,087	-8,913
මුළු උප එකතුව	**242,000**	**233,087**	**-8,913**
අනෙකුත්			
විදුලි සංදේශ බද්ද	18,000	15,127	-2,873
බලපත්‍ර ගාස්තු සහ අනෙකුත්	19,748	62,310	42,562
මුළු උප එකතුව	**37,748**	**77,437**	**39,689**
බදු නොවන ආදායම	**370,000**	**400,210**	**30,210**

ශ්‍රී ලංකා රේගුව විසින් 2025 වසරේ දී එකතු කරන ලද ආදායම, 2024 වසරේ දී වූ රු. බිලියන 1,523.8 සිට රු. බිලියන 2,504.0 දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, එය වාර්ෂික ඇස්තමේන්තුව රු. බිලියන 389.0 කින් ඉක්මවා යාමකි. එලෙසම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2025 වසරේ දී එකතු කරන ලද ආදායම ද 2024 වසරේ දී වූ රු. බිලියන 1,937.8 සිට රු. බිලියන 2,234.6 දක්වා වර්ධනය වූ අතර, එය ද වාර්ෂික ඇස්තමේන්තුව රු. බිලියන 39.4 කින් ඉක්මවා යාමකි. කෙසේ වෙතත්, සුරාබදු දෙපාර්තමේන්තුව 2025 වසරේදී රු. බිලියන 233.1 ක ආදායමක් වාර්තා කළ අතර, එහි වාර්ෂික ඇස්තමේන්තුවට වඩා රු. බිලියන 8.9 ක අඩු වීමක් පෙන්නුම් කරන ලදී.

බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, පරිපාලනමය වශයෙන් සංවර්ධනය සහ දේශීය ආර්ථික ක්‍රියාකාරම් පුළුල් වීම පිළිබිඹු කරමින්, 2025 වසරේ දී දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 1,238.6 සිට රු. බිලියන 1,423.9 දක්වා සියයට 15.0 කින් වර්ධනය විය. ඊට සමගාමීව, 2025 වසරේ දී සමස්ත ආනයන වියදම ඇ. ඩො. මිලියන 21,480 දක්වා සියයට 14.0 කින් ඉහළ යාමත් සමඟ, ප්‍රධාන වශයෙන්ම මෝටර් රථ ආනයනයෙන් ලැබුණු ආදායම ඉහළ යාම, ආනයන මත පදනම් වූ බදු ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 1,398.1 සිට 2025 වසරේ දී රුපියල් බිලියන 2,388.5 දක්වා සියයට 70.8 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කිරීමට හේතු විය.

බදු නොවන ආදායම, 2024 වසරේ වූ රු. බිලියන 326.3 සිට 2025 වසරේ දී රු. බිලියන 400.2 දක්වා සියයට 22.7 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම ලාභ සහ ලාභාංශ රු. බිලියන 56.5 දක්වා සියයට 37.6 කින් වර්ධනය වීම, පොලී ආදායම රු. බිලියන 72.0 දක්වා සියයට 24.7 කින් වර්ධනය වීම, සමාජ ආරක්ෂණ දායකත්වයන් රු. බිලියන 58.8 දක්වා සියයට 36.4 කින් වර්ධනය වීම සහ දඩ මුදල්, ගාස්තු සහ අයකිරීම් රු. බිලියන 180.9 දක්වා සියයට 16.9 කින් වර්ධනය වීම ලෙස උප කාණ්ඩ කිහිපයක දක්නට ලැබුණු කැපී පෙනෙන වර්ධනයන් හේතු විය. සමස්තයක් ලෙස, මෙම වර්ධනයන් තුළින් වසර තුළ පැවති යහපත් ආර්ථික තත්ත්වය සහ පරිපාලනමය වශයෙන් ශක්තිමත් කරන ලද ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය පිළිබිඹු වේ.

ආදායම් බදු

ආදායම් බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 1,026.2 සිට 2025 වසරේ දී රු. බිලියන 1,139.4 දක්වා සියයට 11.0 කින් වර්ධනය වී ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 97.6 ක ලඟා කරගැනීමකි. ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස, ආදායම් බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ සියයට 3.4 සිට 2025 වසරේ දී 3.5 දක්වා ප්‍රතිශතාංක 0.1 කින් ආන්තික වශයෙන් වර්ධනය විය.

පුද්ගල හා සංස්ථාපිත ආදායම් බදුවලින් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 862.2 සිට 2025 වසරේ දී රු. බිලියන 963.6 දක්වා සියයට 11.8 කින් වර්ධනය විය. 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක කරන ලද මත්පැන්, දුම්කොළ, ඔට්ටු සහ සූදු කර්මාන්ත සඳහා සංස්ථාපිත බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 ක් දක්වා ඉහළ දැමීම සහ සේවා අපනයනය සඳහා සියයට 15 ක බදු අනුපාතයක් පැනවීම මඟින් සංස්ථාපිත ආදායම් බද්දෙන් ලද ආදායම 2025 වසරේ දී රු. බිලියන 677.7 දක්වා සියයට 16.0 කින් වර්ධනය වීමට මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම රු. බිලියන 84.8 ක් දක්වා සියයට 5.4 කින් වර්ධනය වී ඇති අතර, 2025 වසරේ අප්‍රේල් මස සිට ක්‍රියාත්මක කරන ලද පෞද්ගලික අංශයේ අවම වැටුප් ඉහළ නැංවීම සහ 2025 වසරේ ජනවාරි මස සිට ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය අංශයේ වැටුප් සංශෝධනය ඇතුළුව වැටුප් මට්ටම් ඉහළ යාම මේ සඳහා හේතු විය. අත්තිකාරම් පුද්ගල ආදායම් බදු/ උපයන විට ගෙවීමේ බදු මඟින් ලද ආදායම රු. බිලියන 201.1 ක් දක්වා සියයට 1.8 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය වී ඇති අතර, 2025 වසරේ අප්‍රේල් මස 01 සිට ක්‍රියාත්මක කරන ලද පුද්ගල ආදායම් බදු නිදහස් සීමාව වසරකට රු. මිලියන 1.2 සිට රු. මිලියන 1.8 දක්වා ඉහළ දැමීම සහ සියයට 18 පුද්ගල ආදායම් බදු අනුපාතයට යටත් වන බදු ස්ථරය පුළුල් කිරීමේ සංයුක්ත බලපෑම මෙයට හේතු විය.

පොළිය මත රඳවා ගැනීමේ බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී රු. බිලියන 163.8 සිට 2025 වසරේ දී රු. බිලියන 175.8 දක්වා සියයට 7.3 කින් වර්ධනය වී ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 76.4 ක ලඟා කරගැනීමකි. පුද්ගල ආදායම් බද්දට යටත් සීමාවට වඩා අඩු ආදායමක් ඇති පුද්ගලයින් සඳහා බැංකු ගිණුම්වලින් පොළිය මත රඳවා ගැනීමේ බදු නිදහස් කිරීම සඳහා ස්වයං ප්‍රකාශන ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දුන්න ද, 2025 වසරේ අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි පොළිය මත රඳවා ගැනීමේ බදු අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කිරීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

බදු අනුකූලතාවය වැඩිදියුණු කිරීම සහ ඩිජිටල්කරණ ක්‍රියාවලින් හඳුන්වාදීම හරහා පරිපාලනමය වශයෙන් ශක්තිමත් වීම තුළින් 2025 වසරේ දී සංස්ථාපිත ආදායම් බදු සඳහා නව ලියාපදිංචි කිරීම් සියයට 24.9 කින් සහ පුද්ගල ආදායම් බදු සඳහා නව ලියාපදිංචි කිරීම් සියයට 18.7 කින් වර්ධනය වී බදු පදනම පුළුල් වීම සඳහා දායක වී ඇත.

සෙස් බද්ද අදියර වශයෙන් ඉවත් කිරීම: ශ්‍රී ලංකාවේ වෙළෙඳ සංදර්භය තුළ පරිවර්තනීය වෙනසක්

1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත යටතේ වන සෙස් බද්ද අදියර වශයෙන් ඉවත් කිරීම ඔස්සේ ශ්‍රී ලංකාව විසින් සිය තීරු බදු ව්‍යුහය සඳහා ප්‍රධාන ප්‍රතිසංස්කරණයක් සිදු කෙරේ. මෙම ප්‍රතිසංස්කරණය තුළින් සංකීර්ණ, ආරක්ෂණවාදී තීරුබදු ව්‍යුහයක සිට සරල, විනිවිදභාවයෙන් යුතු සහ ගෝලීය වශයෙන් තරඟකාරී වෙළෙඳ රාමුවක් සඳහා වන තීරණාත්මක මාරුවීම සනිටුහන් කෙරේ.

වසර ගණනක් මුළුල්ලේ ආදායම් ප්‍රභවයක් සහ දේශීය කර්මාන්ත සඳහා ආරක්ෂණ මෙවලමක් යන දෙයාකාරයෙන්ම සෙස් බද්ද ක්‍රියාත්මක විණි. එනමුත්, රේගු ආනයන බදු නොවන, භාණ්ඩ ආනයනයේ දී පනවන අනෙකුත් බදු වර්ග ද (Para-Tariffs) සමඟ සෙස් බද්ද ද පුළුල් වශයෙන් ක්‍රියාත්මක වීම හේතුවෙන් ආනයනික යෙදවුම්වල පිරිවැය ඉහළ නංවමින් සහ අපනයන තරඟකාරිත්වය දුර්වල කරමින් සංකීර්ණ කාණ්ඩගත තීරු බදු ව්‍යුහයක් (Fragmented Tariff Structure) ඇතිවීමට හේතු විය. වෙළෙඳ ප්‍රතිපත්තියේ විනිවිදභාවය සහ පුරෝකතනය කිරීමේ හැකියාව ද එමඟින් දුර්වල කර තිබේ.

මෙම අභියෝගයන් සැලකිල්ලට ගෙන, තීරු බදු තාර්කිකකරණය, නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ අපනයනාභිමුඛ වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් අදියරගත ආකාරයෙන් සිදුකරන ප්‍රතිසංස්කරණයක් ආරම්භ කර තිබේ.

ප්‍රතිපත්ති රාමුව සහ ක්‍රියාත්මක කිරීම

මෙම ප්‍රතිසංස්කරණය 2023 අයවැයෙහි අයවැය යෝජනා අංක 34.6 යටතේ හඳුන්වා දුන් අතර, අංක 2325/06 දරන ගැසට් නිවේදනය ඔස්සේ ක්‍රියාත්මක කර තිබේ. මෙම කරුණ 2026 අයවැයෙහි අයවැය යෝජනා අංක 35.3 ඔස්සේ ද වැඩිදුරටත් තහවුරු කර ඇති අතර, එමඟින් ආනයනික රෙදිපිළි මත පනවා තිබූ සෙස් බද්ද ඉවත් කරමින් තරඟකාරී මධ්‍යස්ථභාවය පවත්වා ගැනීම සඳහා එකතු කළ අගය මත බද්ද හඳුන්වා දී ඇත.

2026 මාර්තු 03 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය සමඟින්, අංක 2479/38 දරන ගැසට් නිවේදනය ඔස්සේ, ලෝක බැංකුවේ සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් යටතේ සිදුකර ඇති බැඳීම්වලට අනුකූලව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 2,634ක් මත පැනවී ඇති සෙස් බද්ද වසර හතරක් පුරා අදියරගත ආකාරයෙන් ඉවත් කිරීම විධිමත් කර තිබේ.

ප්‍රාග්ධන, අතරමැදි සහ පාරිභෝජන භාණ්ඩ අතර සංගතභාවය සහතික කිරීම සඳහා මෙම වර්ගීකරණයේ දී එක්සත් ජාතීන්ගේ පුළුල් ආර්ථික වර්ගීකරණය අනුගමනය කෙරේ.

අදියර ගත ආකාරයෙන් සෙස් බද්ද ඉවත් කිරීමේ සැලසුම						
අනුක්‍රමික අංකය	භාණ්ඩ වර්ගය	තීරුබදු අයිතම	2026	2027	2028	2029
1	ආන්තික අනුප්‍රමාණ (<5%)	46	100%	-	-	-
2	අතරමැදි භාණ්ඩ හා ප්‍රාග්ධන භාණ්ඩ	693	50%	25%	25%	-
3	සංවේදී කාණ්ඩයේ අතරමැදි භාණ්ඩ හා ප්‍රාග්ධන භාණ්ඩ	107	-	25%	25%	50%
4	ආනයනික රෙදි	265	100%	-	-	-
5	පාරිභෝජන භාණ්ඩ	1,523	-	-	-	100%
	එකතුව	**2,634**				

දත්ත මූලාශ්‍රය: වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ප්‍රතිසංස්කරණවල ආර්ථික බලපෑම්

1. දේශීය නිෂ්පාදකයන්

යෙදවුම් සහ යන්ත්‍රෝපකරණ මත පනවා ඇති සෙස් බද්ද ඉවත්කිරීම මඟින් නිෂ්පාදන වියදම් අඩුවන අතර එමඟින් කාර්යක්ෂමතාවය, තාක්ෂණ අනුගතබව, සහ නිෂ්පාදිතයේ ගුණාත්මකබව වැඩිදියුණු වීම සඳහා අවස්ථාව සැලසේ. එසේ වුව ද, ආනයනවලින් ඇතිවන වැඩි වූ තරඟකාරිත්වය මඟින් අඩු තරඟකාරිත්වයක් සහිත ආයතන කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකිය.

2. ආනයනකරුවන්

අඩු බදු ප්‍රමාණ යටතේ ආනයන පිරිවැය අඩුවන අතර ව්‍යාපාරික අවස්ථා පුළුල් කෙරේ. එසේ වුව ද, වැඩිවන වෙළෙඳපොළ ප්‍රවේශය මඟින් තරඟකාරිත්වය තියුණුවන අතර ලාභදායීබව සීමා වේ.

3. අපනයනකරුවන්

අඩු කළ යෙදවුම් පිරිවැය, ගෝලීය වෙළෙඳපොළවල් තුළ මිල තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම මඟින් අපනයනකරුවන් සැලකිය යුතු ආකාරයෙන් ප්‍රතිලාභ හිමිකර ගන්නා අතර එය අපනයන වර්ධනය සහ විවිධාංගීකරණයට රුකුලක් වේ.

4. පාරිභෝගිකයින්

වැඩිදියුණු වූ තරඟකාරිත්වය ඔස්සේ අඩු කළ මිල ගණන්, වැඩිදියුණු ගුණාත්මකබව සහ පුළුල් වශයෙන් පවතින විවිධ වර්ගයේ භාණ්ඩ මඟින් පාරිභෝගිකයන්ට වාසි අත්වේ.

සෙස් බද්ද අදියර වශයෙන් ඉවත් කිරීම: ශ්‍රී ලංකාවේ වෙළෙඳ සංදර්භය තුළ පරිවර්තනීය වෙනසක් සම්බන්ධිතයි...

දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම

ශ්‍රී ලංකාව විසින් වෙළෙඳ කටයුතු ලිහිල්කරණය සිදුකර ඇති බැවින්, අසාධාරණ පරිචයන්ගෙන් දේශීය කර්මාන්ත ආරක්ෂා කරගැනීම සඳහා ලෝක වෙළෙඳ සංවිධානය සමඟ අනුගත ආරක්ෂාකාරී පියවර ශක්තිමත් කර තිබේ.

1. වෙළෙඳ ප්‍රතිකර්ම

2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ දැනටමත් 2025 මාර්තු 27 දිනැති අංක 2429/32 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය මඟින් නියෝග ප්‍රකාශයට පත්කර තිබේ.

- ප්‍රපාතන විරෝධී පියවර මඟින් සාධාරණ අගයට පහළින් අලෙවිවන ආනයන සම්බන්ධයෙන් විසඳුම් ලබාදේ.
- ප්‍රතිතෝලන බදු මඟින් විදේශවලින් ප්‍රදානය කර ඇති සහන නිලව් කෙරේ.

මෙම පියවරවලින් නීත්‍යානුකූල වෙළෙඳ කටයුතු සීමා නොකරමින් සාධාරණ තරඟකාරිත්වය සහතික කෙරේ.

2. ප්‍රමිතීන් සහ තාක්ෂණ රෙගුලාසි

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ශක්තිමත් නිෂ්පාදිත ප්‍රමිතීන් සහ සහතිකකරණයන්වලින් ආනයනවල ගුණාත්මකබව සහ සුරක්ෂිතතාවය සහතික කෙරේ.

- ප්‍රධාන නිෂ්පාදිත සඳහා පැවතිය යුතු අනිවාර්ය සහතිකකරණයන්
- දේශසීමා මායිම් ආශ්‍රිතව සිදුකරන පරීක්ෂණ සහ පරීක්ෂා කිරීම්
- බාල තත්ත්වයේ භාණ්ඩ ප්‍රතික්ෂේප කිරීම

මෙම පියවරවලින් සාධාරණ තරඟකාරිත්වය පවත්වා ගන්නා අතරතුර පාරිභෝගිකයන් ආරක්ෂා කෙරේ.

3. ආයතනික සම්බන්ධීකරණය

ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව රෙගුලාසි ශක්තිමත් කිරීම, බලාත්මක කිරීම සහ අනුගත කිරීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව ඇතුළු ප්‍රධාන ආයතන සාමූහිකව කටයුතු කරනු ලැබේ.

ක්‍රමෝපායික ප්‍රතිපත්ති හැරවුම

සෙස් බද්ද අදියරගත ආකාරයෙන් ඉවත් කිරීමෙන් පුළුල් තීරු බදු ආරක්ෂණයේ සිට ඉලක්කගත, රීති පදනම් වෙළෙඳ ප්‍රතිපත්ති මෙවලම් වෙත පරිවර්තනය වීම පිළිබිඹු කෙරේ. එමඟින් පහත කරුණු ආශ්‍රිත වැඩිදියුණු වීමක් සිදුවේ:

- පාරදෘශ්‍යතාවය සහ පුරෝකතනය කළ හැකිබව
- ව්‍යාපාර කිරීම පහසු කිරීම
- අපනයන තරඟකාරීත්වය
- ගෝලීය අගය දාමයන්ට ඒකාබද්ධ වීම

එමෙන්ම, සවිබල ගන්වන ලද ආරක්ෂණ ක්‍රම මඟින් අසාධාරණ වෙළෙඳ පරිචයන්වලින් දේශීය කර්මාන්ත ආරක්ෂා වී පැවතීම සහතික කෙරේ.

සමාප්තිය

අදියරගත ආකාරයෙන් සෙස් බද්ද ඉවත් කිරීම යනු ශ්‍රී ලංකාවේ වෙළෙඳ ක්‍රමය නවීකරණය කිරීම සඳහා වූ තීරණාත්මක පියවරකි. පිරිවැය අඩු කිරීම, කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, සහ ගෝලීය මිතා පරිචයන් සමඟ අනුකූලතාවය ඇතිකිරීම මඟින් මෙම ප්‍රතිසංස්කරණ ඔස්සේ තිරසර, අපනයනාභිමුඛ වර්ධනයක් සඳහා රුකුලක් සැපයේ. ඵලදායී ක්‍රියාත්මක කිරීම, ආයතනික සම්බන්ධීකරණය, සහ වඩාත් තරඟකාරී පරිසරයක් සඳහා අනුගත වීම සඳහා දේශීය කර්මාන්ත සතු හැකියාව මත මෙහි සාර්ථකත්වය රඳී පවතින අතර, දේශීය කර්මාන්ත සහ පාරිභෝගිකයින් ආරක්ෂා කරගැනීම සඳහා රජය කැපවී සිටී.

රු. මිලියන

අයිතමය	2021	2022	2023	2024	2025(අ)
බදු ආදායම	**1,298,019**	**1,751,132**	**2,720,563**	**3,704,577**	**5,049,192**
ආදායම් බදු	302,115	534,021	911,355	1,026,199	1,139,373
එකතු කළ අගය මත බදු	308,213	463,072	694,460	1,309,680	1,746,874
ජාතිය ගොඩනැගීමේ බදු	434	413	328	137	488
නිෂ්පාදන බදු *	306,898	342,563	469,622	598,529	1,058,707
ආනයන බදු	64,339	50,009	105,120	111,147	275,894
වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු	154,125	180,595	175,486	170,014	180,853
විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු	55,828	40,194	51,327	115,199	164,599
සමාජ ආරක්ෂණ දායකත්ව බදු	-	36,111	216,181	250,869	294,520
අනෙකුත්	106,067	104,154	96,683	122,804	187,884
බදු නොවන ආදායම	**159,052**	**228,052**	**328,259**	**326,261**	**400,210**
පොලී/කුලී	11,556	13,188	33,231	64,192	79,872
ලාභ සහ ලාභාංශ	30,591	28,092	75,701	41,080	56,543
විකුණුම් සහ ගාස්තු	42,645	90,050	146,566	154,731	180,935
සමාජ ආරක්ෂණ දායක මුදල්	34,619	37,416	36,258	43,089	58,794
මහ බැංකු පැවරුම්	15,012	30,007	1,029	-	-
අනෙකුත්	24,630	29,300	35,474	23,170	24,066
මුළු ආදායම	**1,457,071**	**1,979,184**	**3,048,822**	**4,030,838**	**5,449,402**
ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස					
බදු ආදායම	**7.4**	**7.3**	**9.9**	**12.3**	**15.4**
ආදායම් බදු	1.7	2.2	3.3	3.4	3.5
එකතු කළ අගය මත බදු	1.7	1.9	2.5	4.4	5.3
ජාතිය ගොඩනැගීමේ බදු	...	...	...	...	...
නිෂ්පාදන බදු	1.7	1.4	1.7	2.0	3.2
ආනයන බදු	0.4	0.2	0.4	0.4	0.8
වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු	0.9	0.8	0.6	0.6	0.6
විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු	0.3	0.2	0.2	0.4	0.5
සමාජ ආරක්ෂණ දායකත්ව බදු	-	0.2	0.8	0.8	0.9
අනෙකුත්	0.6	0.4	0.4	0.4	0.6
බදු නොවන ආදායම	**0.9**	**0.9**	**1.2**	**1.1**	**1.2**
පොලී/කුලී	0.1	0.1	0.1	0.2	0.2
ලාභ සහ ලාභාංශ	0.2	0.1	0.3	0.1	0.2
විකුණුම් සහ ගාස්තු	0.2	0.4	0.5	0.5	0.6
සමාජ ආරක්ෂණ දායක මුදල්	0.2	0.2	0.1	0.1	0.2
මහ බැංකු පැවරුම්	0.1	0.1	...	-	-
අනෙකුත්	0.1	0.1	0.1	0.1	0.1
මුළු ආදායම	**8.3**	**8.2**	**11.1**	**13.4**	**16.6**

එකතු කළ අගය මත බද්ද

නාමික වශයෙන්, එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 1,309.7 සිට 2025 වසරේ දී රු. බිලියන 1,746.9 දක්වා සියයට 33.4 ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කරන ලදී. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සහ ආනයන මගින් රැස්කරගන්නා ලද එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම සැලකිය යුතු ලෙස වැඩිවීම මෙන්ම 2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බද්ද සඳහා වන ලියාපදිංචි වීමේ සීමාව වාර්ෂිකව රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීමෙන් සමස්ත වසරේ දී ලද බලපෑම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. දේශීය ක්‍රියාකාරකම් සඳහා වන එකතු කළ අගය මත බදු ආදායම 2024 වසරේ දී රු. බිලියන 712.2 සිට 2025 වසරේ දී රු. බිලියන 855.5 දක්වා සියයට 20.1 කින් වර්ධනය වී ඇත. එයින් මූල්‍ය සේවා සඳහා වන එකතු කළ

අගය මත බදු ආදායම රු. බිලියන 198.2 ක් වූ අතර එය 2024 වසරේදී වූ රු. බිලියන 120.4 සිට සියයට 64.7 ක සැලකිය යුතු වැඩිවීමක් පිළිබිඹු කරයි. ආනයනවලින් ලද එකතු කළ අගය මත බදු ආදායම 2024 වසරේ දී රු. බිලියන 597.5 සිට 2025 වසරේ දී රු. බිලියන 891.4 දක්වා සියයට 49.2 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර, ආනයන සීමා ඉවත් කිරීමෙන් පසු මෝටර් රථ ආනයනය නැවත ආරම්භ කිරීම ඊට ප්‍රධාන වශයෙන් හේතු විය.

2025 වසරේ දී සමස්ත බදු ආදායමට එකතු කළ අගය මත බද්දෙන් වූ දායකත්වය සියයට 34.6 ක් විය. ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ සියයට 4.4 ට සාපේක්ෂව 2025 වසරේ දී සියයට 5.3 දක්වා සියයට 1.0 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර, එමගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයේ සහ දේශීය වශයෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රයත්නයන්හි ප්‍රධාන මෙවලමක් ලෙස එකතු කළ අගය මත බද්දෙහි වැදගත්කම පිළිබිඹු කරයි.

මෙසේ සැලකිය යුතු මට්ටමක වර්ධනයක් පිළිබිඹු වුවත්, 2024 වසරේ අග භාගයේ සිට ආනයන සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කරනු ලැබුව ද, 2024 වසර පුරා ක්‍රියාත්මක වූ ආනයන සීමාවන්හි පසු බලපෑම් තව දුරටත් පිළිබිඹු කරමින් ආනයන මත එකතු කළ අගය මත බද්දෙන් ලැබිය හැකි සමස්ත ආදායමෙහි විභවතාවය තවමත් සම්පූර්ණයෙන්ම ලඟාකර ගැනීමට නොහැකි වී ඇත.

එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායමේ සමස්ත වැඩිවීම මගින් ශක්තිමත් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග සහ අඛණ්ඩ පරිපාලන ප්‍රතිසංස්කරණ හේතුවෙන් සිදු වූ බදු පරිපාලනයේ සහ බදු අනුකූලතාවයෙහි වැඩි දියුණුවීම් පිළිබිඹු කරන අතර, එය ආදායම් රැස්කිරීමේ ප්‍රයත්නයන් සඳහා අඛණ්ඩව සහාය වී ඇත. මූල්‍ය සේවා අංශය ද ඇතුළුව එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ ආයතන සංඛ්‍යාව 2024 වසරේ දෙසැම්බර් මස අග වන විට වූ 21,227 සිට 2025 වසරේ දෙසැම්බර් මස අග වන විට 33,187 දක්වා සියයට 56.3 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. බදු පදනම පුළුල් කිරීම සහ බදු අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා දරන ලද අඛණ්ඩ ප්‍රයත්නයන් පිළිබිඹු කරමින් මෙම ඉහළ යාමේ ප්‍රවණතාවය 2026 වසර දක්වා ව්‍යාප්ත වී 2026 වසරේ පෙබරවාරි අග වන විට ලියාපදිංචි වී ඇති එකතු කළ අගය මත බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව 34,769 දක්වා තවදුරටත් වර්ධනය වී ඇත.

එකතු කළ අගය මත බදු ආදායම

රු. මිලියන

අයිතමය	2021	2022	2023	2024	2025 (a)
දේශීය	185,918	292,293	469,768	712,326	857,620
ආනයන	122,766	171,478	225,401	598,048	899,932
දළ ආදායම	**308,684**	**463,771**	**695,169**	**1,310,374**	**1,757,552**
ආපසු ගෙවීම	471	699	709	694	10,678
ශුද්ධ ආදායම	**308,213**	**463,072**	**694,460**	**1,309,680**	**1,746,874**
ශුද්ධ ආදායම ද.දේ.නි.% ලෙස	**1.7**	**1.9**	**2.5**	**4.4**	**5.3**

රජයේ බදු ආදායම - ප්‍රභවයන් අනුව

රු. මිලියන

මූලාශ්‍රය	2024	2025(අ)	2024/2025 වෙනස (%)
ආදායම් බදු	**1,026,199**	**1,139,373**	**11.0**
දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු	**1,238,560**	**1,423,851**	**15.0**
එකතු කළ අගය මත බදු - දේශීය	712,187	855,485	20.1
ජාතිය ගොඩනැගීමේ බදු - දේශීය	130	81	-37.8
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - දේශීය	186,477	221,906	19.0
සුරාබදු	213,390	231,542	8.5
දුම්වැටි සහ දුම්කොළ මත බදු	118,339	102,718	-13.2
නිෂ්පාදන බදු - අනෙකුත්	8,039	12,120	50.8
ආනයනය මත පදනම් වූ බදු	**1,398,143**	**2,388,456**	**70.8**
ආනයන බදු	111,147	275,894	148.2
එකතු කළ අගය මත බදු - ආනයන	597,493	891,390	49.2
ජාතිය ගොඩනැගීමේ බදු - ආනයන	8	407	5,268.3
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - ආනයන	64,392	72,614	12.8
වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු	170,014	180,853	6.4
විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු	115,199	164,599	42.9
සෙස් බදු	81,129	90,373	11.4
නිෂ්පාදන බදු - ඛනිජ තෙල්	200,200	240,575	20.2
නිෂ්පාදන බදු - මෝටර් රථ	58,562	471,751	705.6
බලපත්‍ර සහ අනෙකුත්	**41,675**	**97,512**	**134.0**
විදුලි සංදේශ බදු	15,927	15,127	-5.0
අනෙකුත්	25,748	82,385	220.0
මුළු බදු ආදායම	**3,704,577**	**5,049,192**	**36.3**

සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 250.9 සිට 2025 වසරේ දී රු. බිලියන 294.5 දක්වා සියයට 17.4 කින් වර්ධනය වී ඇත. දේශීය හා ආනයන ක්‍රියාකාරකම් පුළුල් ලෙස ව්‍යාප්ත වීම හේතුවෙන් මෙම වර්ධනය සිදු වූ අතර, දේශීය ක්‍රියාකාරකම්වලින් ලද සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම රු. බිලියන 221.9 දක්වා සියයට 19.0 කින් ද ආනයනවලින් ලද සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම රු. බිලියන 72.6 දක්වා සියයට 12.8 කින් ද වර්ධනය වී ඇත. 2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වාර්ෂිකව රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීමෙන් සමස්ත වසරේ දී ලද බලපෑම පිළිබිඹු කරමින් ලියාපදිංචි වූ ආයතන සංඛ්‍යාව 2024 වසරේ දී වූ 12,097 සිට 2025 වසරේ දී 16,206 දක්වා සියයට 34.0 කින් වර්ධනය වී ඇත. සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 111.6 ක ලඟාකර ගැනීමකි.

නිෂ්පාදන/ සුරා බද්ද

බදු ආදායමට තෙවනුව විශාලතම දායකත්වය දක්වන නිෂ්පාදන/ සුරා බද්දෙන් ලද සමස්ත ආදායම, නිෂ්පාදන බදු අය කළ හැකි ප්‍රධාන කාණ්ඩ කිහිපයක ශක්තිමත් කාර්යසාධනයක් පිළිඹිබු කරමින් 2024 වසරේ දී වූ රු. බිලියන 598.5 සිට 2025 වසරේ දී රු. බිලියන 1,058.7 දක්වා සියයට 76.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. වාර්ෂික උද්ධමනයට ගැළපුම්ගත කරමින් දර්ශකකරණ ක්‍රමවේදය මත පදනම්ව 2025 වසරේ ජනවාරි මස 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කළ නිෂ්පාදන/සුරා බදු අනුපාතවල සංශෝධන මගින් සමස්ත වසරේ දී ලද බලපෑම හේතුවෙන් මෝටර් රථ, ඛනිජ තෙල් නිෂ්පාදන සහ මත්පැන්වලින් ලද ආදායම ඉහළ යාම මෙම වර්ධනයට බොහෝ දුරට හේතු විය.

නිෂ්පාදන/සුරාබදු ආදායම

රු. මිලියන

අයිතමය	2021	2022	2023	2024	2025 [a]
මත්පැන්	138,637	165,188	170,260	213,390	231,542
දුම්වැටි (දුම්කොළ ඇතුළත්ව)	88,576	104,200	118,481	118,339	102,718
මෝටර් වාහන	18,113	14,504	32,526	58,562	471,751
ඛනිජ තෙල් නිෂ්පාදන	55,339	53,074	143,642	200,200	240,575
අනෙකුත්	6,234	5,598	4,713	8,039	12,120
එකතුව	**306,898**	**342,563**	**469,622**	**598,529**	**1,058,707**

දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම



2025 වසරේ පෙබරවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ සඳහා පනවා තිබූ තාවකාලික ආනයන සීමාවන් ලිහිල් කිරීම හේතුවෙන් මෝටර් රථ සඳහා නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 58.6 සිට 2025 වසරේ දී රු. බිලියන 471.8 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය. ආනයන ප්‍රමාණයන් සුළු වශයෙන් වැඩිවීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 200.2 සිට 2025 වසරේ දී රු. බිලියන 240.6 දක්වා සියයට 20.2 කින් වර්ධනය විය. කෙසේ වෙතත් , දුම්වැටිවලින් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 118.3 සිට 2025 වසරේ දී රු. බිලියන 102.7 දක්වා සියයට 13.2 කින් අඩු විය.

මත්පැන් හා දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන/සුරාබදු ආදායම

වර්ෂය	නිෂ්පාදනය/ අලෙවිය						නිෂ්පාදන/සුරා බදු ආදායම			
	සැර මත්පැන් (ලීටර් මිලියන)	% වෙනස	ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය (ලීටර් මිලියන)	% වෙනස	දුම්වැටි (මිලියන)	% වෙනස	මත්පැන් (රු. බිලියන)	% වෙනස	දුම්වැටි (රු. බිලියන)	% වෙනස
2015	51.8	17.9	125.8	1.0	4,116	9.0	105.9	53.3	80.0	39.9
2016	55.6	7.3	52.2	-58.5	3,789	-7.9	120.8	14.1	88.8	11.0
2017	46.9	-15.5	71.1	36.3	3,149	-16.9	113.7	-5.9	86.0	-3.2
2018	25.3 [a]	-46.1	11.4 [a]	-84.0	3,150	0.02	113.9	0.2	92.2	7.2
2019	24.7	-2.4	19.1	67.9	2,622	-16.8	115.4	1.3	87.4	-5.2
2020	22.0	-10.9	11.4	-40.4	2,287	-12.8	121.0	4.9	94.3	8.0
2021	25.0	13.6	12.5	9.6	2,384	4.3	138.6	14.6	88.5	-6.2
2022	27.0	8.0	14.1	12.8	2,825	18.5	165.2	19.2	104.2	17.6
2023	20.4	-24.3	13.6	-3.5	2,303	-18.5	170.3	3.1	117.5	12.8
2024	19.2	-5.8	14.2	4.9	1,923	-16.5	213.4	25.3	117.1	-0.3
2025	22.3	16.1	15.0	5.6	1,935	0.6	231.5	8.5	101.2	-13.6

මත්පැන් නිෂ්පාදනය සහ නිෂ්පාදන/සුරාබදු ආදායම



සමස්ත නිෂ්පාදන/ සුරා බදු ආදායමට සියයට 21.9 ක දායකත්වයක් ලබා දෙමින්, මත්පැන් මත සුරා බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 213.4 සිට 2025 දී රු. බිලියන 231.5 දක්වා සියයට 8.5 කින් වර්ධනය විය. උද්ධමනයට ගැළපුම්ගත කරමින් දර්ශකකරණ ප්‍රතිපත්තිය මත පදනම්ව 2025 වසරේ ජනවාරි මස 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බදු අනුපාතය සියයට 5.9 කින් සංශෝධනය කිරීම මෙම වර්ධනයට හේතු වූ අතර, ඇස්තමේන්තුවෙන් සියයට 96.5 ක ආදායමක් ළඟා කරගැනීමට හැකි විය. කෙසේ වෙතත්, මත්පැන් නිෂ්පාදනය 2024 වසරේ දී වූ නිරපේක්ෂ ලීටර් මිලියන 33.4 සිට 2025 වසරේ දී නිරපේක්ෂ ලීටර් මිලියන 37.3 දක්වා සියයට 11.7 කින් වර්ධනය විය.

නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සඳහා වාර්ෂික උද්ධමනයට ගැළපුම්ගත කරමින් දර්ශකකරණ ක්‍රමවේදය මත පදනම්ව 2025 වසරේ ජනවාරි මස 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බදු අනුපාතය සියයට 5.9 කින් සංශෝධනය කිරීම හේතුවෙන් පැණි බීම වර්ග, ශීතකරණ, පාම් තෙල් සහ මේද අම්ල ඇතුළු අනෙකුත් නිෂ්පාදන බද්දට යටත් අයිතම සඳහා නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 8.0 ට සාපේක්ෂව 2025 වසරේ දී රු. බිලියන 12.1 දක්වා සියයට 50.8 කින් වර්ධනය විය.

මත්පැන් මත නිෂ්පාදන බදුද සංශෝධනය කිරීමේ ව්‍යුහය

මත්පැන් වර්ගය	නිරපේක්ෂ ලීටරයක් සඳහා පෙර සුරාබදු (රු.) (2024 ජනවාරි 01 සිට)	නිරපේක්ෂ ලීටරයකට නව සුරාබදු (රු.) (2025 ජනවාරි 11 සිට)
විශේෂ අරක්කු	6,840	7,244
මොලැසස් / තල් / පොල් අරක්කු	7,320	7,752
මෙරට නිෂ්පාදිත විදේශ මත්පැන්	7,525	7,969
බියර් (සැර - 5% ට අඩු)	5,415	5,735
අධි සාන්ද්‍ර බියර් (සැර - 5% ට වැඩි හෝ සමාන)	5,680	6,015
වයින්	5,415	5,735
සෙසේ	1,480	1,567
කිරි පොන්සා	3,760	3,982
සයිඩර්	4,105	4,347

රේගු ආනයන බද්ද

රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 111.1 සිට 2025 වසරේ දී රු. බිලියන 275.9 දක්වා සියයට 148.2 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මෙම වර්ධනය සඳහා මූලික වශයෙන් රු. බිලියන 146 ක ආදායමක් උපයමින් රේගු ආනයන බදු ආදායම සඳහා සියයට 53.0 ක දායකත්වයක් සපයන ලද මෝටර් රථ ආනයනය නැවත ආරම්භ කිරීම මෙන්ම ආනයන ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ වෙළෙඳ කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත්වීම හේතු විය. රේගු ආනයන බදු ආදායම සඳහා දායක වූ අනෙකුත් ප්‍රධාන භාණ්ඩ අතරට කිරිපිටි, ලිහිසි තෙල් සහ තිරිඟු ධාන්‍ය ඇතුළත් විය.

විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද

සීනි, ලොකු ළූණු සහ අර්තාපල් ඇතුළු තෝරාගත් භාණ්ඩ සඳහා බදු අනුපාත ඉහළ දැමීම මෙන්ම අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 115.2 සිට 2025 වසරේ දී රු. බිලියන 164.6 දක්වා සියයට 42.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. අර්තාපල්, බී ළූණු, සීනි සහ පොල්තෙල් තුළින් ඉහළම විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම උපයන ලදී. විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 126.0, රු. බිලියන 38.6 කින් ඉක්මවා යන ලදී.

වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද

වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 170.0 සිට 2025 වසරේ දී රු. බිලියන 180.9 දක්වා සියයට 6.4 කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර, පුළුල් පරාසයක පැතිරී ඇති ආනයනික භාණ්ඩ සඳහා මෙම බද්ද අඛණ්ඩව අය කිරීම සහ වැඩිදියුණු වූ රේගු ක්‍රියාවලීන් බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් මේ සඳහා හේතු විය. වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද යටතේ ආදායම් උපයන ලද ප්‍රධාන අයිතම අතරට බොරතෙල්, කිරිපිටි, වානේ සහ සිමෙන්ති ක්ලින්කර් ඇතුළත් විය.

වෙළඳ භාණ්ඩ අපනයන සහනාධාර යෝජනා ක්‍රමය (සෙස් බද්ද)

ආනයන හා අපනයන මත සෙස් බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 81.1 සිට 2025 වසරේ දී රු. බිලියන 90.4 දක්වා සියයට 11.4 කින් වර්ධනය වූ අතර, අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා වූ සීමාවන් ලිහිල් කිරීමෙන් පසු ආනයන ප්‍රමාණයන් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ආනයන සඳහා වන සෙස් බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 79.1 සිට 2025 වසරේ දී රු. බිලියන 88.7 දක්වා සියයට 12.1 කින් වර්ධනය වී, අපනයන සඳහා වන සෙස් බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 2.0 සිට 2025 වසරේ දී රු. බිලියන 1.6 දක්වා අඩු වී ඇති අතර අපනයන සඳහා වන සෙස් බද්දෙන් ලද ආදායම සඳහා තේ සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රධාන වශයෙන් දායකත්වය ලබා දී ඇත.

ජාත්‍යන්තර වෙළඳ කටයුතු මඟින් ඉපැයූ සෙස් බදු ආදායම සහ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා රජයේ සහනාධාර - 2023-2025

'අ' තාවකාලික

රු. මිලියන

විස්තරය	2023	2024	2025(අ)	විස්තරය	2023	2024	2025(අ)
අපනයන මත සෙස් බද්ද	**2,229**	**1,996**	**1,644**	**වාණිජ බෝග සංවර්ධනය**	**56,008**	**41,518**	**39,612**
තේ - තේ (බදු සහ අපනයන පාලන) පනත, තේ මණ්ඩල නීති යටතේ	523	415	369	තේ	686	499	745
රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ	7	11	24	රබර්	655	515	495
පොල් - පොල් සංවර්ධන පනත යටතේ	186	213	160	පොල්	450	500	718
අ.සං.ම. සෙස් බද්ද - අපනයන සංවර්ධන පනත යටතේ	1,513	1,357	1,092	කජු	47	55	8
ආනයන මත සෙස් බද්ද	**54,955**	**79,133**	**88,728**	සුළු අපනයන බෝග (කුරුඳු, කොකෝවා, කෝපි, ගම්මිරිස්)	388	370	831
ආනයන සෙස් බද්ද - අපනයන සංවර්ධන පනත යටතේ	54,955	79,133	88,728	සමස්ත කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා පොහොර සහනාධාරය	53,782	39,579	36,815
එකතුව	**57,184**	**81,129**	**90,373**	**එකතුව**	**56,008**	**41,518**	**39,612**

කාණ්ඩ 4 ක් යටතේ පවතින බදු ව්‍යුහයක් සහිතව රේගු ආනයන බද්ද සංස්කරණය

1. සමස්ත විග්‍රහය

2026 මාර්තු 03 දිනැතිව ප්‍රකාශයට පත්කළ අංක 2478/03 දරන ගැසට් නිවේදනය මඟින් 2026 අප්‍රේල් 1 වැනි දින සිට බලාත්මක වන පරිදි කාණ්ඩ 4 ක් යටතේ රේගු ආනයන බදු (Customs Import Duty - CID) රාමුව හඳුන්වාදීම සමඟින් ශ්‍රී ලංකාවේ ජාතික රේගු ආනයන බදු ප්‍රතිපත්තිය (National Tariff Policy - NTP) යටතේ සුවිශේෂී ව්‍යුහාත්මක සංස්කරණයක් සනිටුහන් කරයි. මෙම සංශෝධන වලින් පැවතුන රේගු ආනයන බදුක්‍රමය තාර්කීකරණය, විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ ජාත්‍යන්තර මනා පරිචයන් සමඟ අනුකූලතාවය ඇති කෙරේ. ජාතික සංවර්ධන වැඩසටහන"පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" සඳහා මෙම ප්‍රතිසංස්කරණ ඔස්සේ රුකුලක් සැපයෙන අතර, මධ්‍යකාලීන අපනයන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා දායකත්වයක් සැපයේ.

2. මෙම ප්‍රතිසංස්කරණයේ ප්‍රධාන අංග

මෙම ප්‍රතිසංස්කරණ ඔස්සේ පහත අංගවලින් යුතු මනාව සංවිධිත සහ ප්‍රමිතිගත රේගු ආනයන බදු ව්‍යුහයක් හඳුන්වා දෙනු ලැබේ:

- කාණ්ඩ හතරක් යටතේ රේගු ආනයන බදු ව්‍යුහය යොදා ගැනීම
- එක්සත් ජාතීන්ගේ පුළුල් ආර්ථික වර්ගීකරණයේ 5 වැනි සංස්කරණය (BEC, Rev.5) සමඟ අනුකූලතාවය
- දේශීය නිෂ්පාදනය සඳහා රුකුලක් වීම සඳහා එම නිෂ්පාදන සඳහා උපයෝගී කරගන්නා යෙදවුම්වල රේගු ආනයන බදු අඩු කිරීම
- පාරිභෝජන භාණ්ඩ මත පනවා ඇති රේගු ආනයන බදු තාර්කීකරණය
- බහුතරයක් වූ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (Tariff lines) ඔස්සේ ස්ථාවරත්වය පවත්වා ගැනීම

3. රේගු ආනයන බදු ව්‍යුහය

2026 මාර්තු 03 දිනැති අංක 2478/03 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශිත පරිදි, මෙම සංශෝධිත රේගු ආනයන බදු ක්‍රමයේ සියයට 0, සියයට 10, සියයට 20 සහ සියයට 30 වශයෙන් වූ අනුප්‍රමාණ යටතේ කාණ්ඩ හතරකින් යුතු රේගු ආනයන බදු ව්‍යුහයක් (4-Band CID Structure) ඇතුළත් වන අතර, එක්සත් ජාතීන්ගේ පුළුල් ආර්ථික වර්ගීකරණයේ 5 වැනි සංස්කරණය යටතේ වන භාණ්ඩවල ආර්ථික කාණ්ඩකරණය මත පදනම්ව කාණ්ඩ දෙකකට පහත පරිදි වර්ගීකරණය කෙරේ:

ක්‍රමවේදය

රේගු ආනයන බදු අනුප්‍රමාණය	කාණ්ඩය	අරමුණ
0%	අතරමැදි සහ ප්‍රාග්ධන භාණ්ඩ	සැපයුම් අඛණ්ඩතාවය සහතික කිරීම සහ නිෂ්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීම
10%	අතරමැදි සහ ප්‍රාග්ධන භාණ්ඩ	සැපයුම් අඛණ්ඩතාවය සහතික කිරීම සහ නිෂ්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීම
20%	පාරිභෝජන භාණ්ඩ	ආදායම් බලගැන්වීම සහ ඉල්ලුම් කළමනාකරණය
30%	පාරිභෝජන භාණ්ඩ	ආදායම් බලගැන්වීම සහ ඉල්ලුම් කළමනාකරණය

4. ආවරණය සහ ව්‍යාප්තිය

මෙම සංස්කරණවලින් සමස්තයක් ලෙස සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (Tariff lines) 8,225ක් ආවරණය කෙරෙන අතර, ප්‍රතිපත්තිමය අඛණ්ඩතාවය සහතික කරමින් එකී සංයෝජිත වර්ගීකරණ සංකේතාංක වලින් සියයට 85.2ක බදු අනුප්‍රමාණ නොවෙනස්ව පවතී.

මීට අමතරව, නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක උප බෙදීම් (HS sub-divisions) 76ක් හඳුන්වා දීම, පැවති උප බෙදීම් 27ක් ඉවත් කර තිබෙන අතර, වර්ගීකරණ නිරවද්‍යතාවය හා නියාමන අධීක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා තෝරාගත් ඇතැම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා අදාළ වන විස්තරය සංශෝධනය කර තිබේ.

සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (HS CODES) අනුව රේගු ආනයන බදු අනුප්‍රමාණයන් පැනවීම ව්‍යාප්තව ඇති ආකාරය

CID අනුප්‍රමාණ කාණ්ඩය	2026 මාර්තු 31 වැනි දිනට		2026 අප්‍රේල් 01 වැනි සිට බලාත්මක වූ	
	සං.ව.සංකේතාංක සංඛ්‍යාව	%	සං.ව.සංකේතාංක සංඛ්‍යාව	%
0% (නිදහස්)	3,725	45.6%	3,756	45.7%
10%	-	-	406	4.9%
15%	526	6.4%	-	-
20%	2,660	32.5%	2,195	26.7%
30%	-	-	582	7.1%
මිශ්‍ර අනුප්‍රමාණ	413	5.1%	411	5.0%
නිශ්චිත අනුප්‍රමාණ	852	10.4%	875	10.6%
එකතුව	**8,176**	**100.0%**	**8,225**	**100.0%**

මූලාශ්‍රය: වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

කාණ්ඩ 4 ක් යටතේ පවතින බදු ව්‍යුහයක් සහිතව රේගු ආනයන බද්ද සංස්කරණය සම්බන්ධිතයි...

සමස්ත සං.වි.සංකේතාංක මිශ්‍රයේ රේගු ආනයන බදු අනුප්‍රමාණයන් පැනවී ඇති ආකාරය



- 2026 මාර්තු 31 වැනි දිනට රේගු ආනයන බදු පනවා තිබූ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සංඛ්‍යාවේ ප්‍රතිශතය (එකතුව 8,176)
- 2026 අප්‍රේල් 01 වැනි දින සිට රේගු ආනයන බදු පැනවෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සංඛ්‍යාවේ ප්‍රතිශතය (එකතුව 8,225)

දත්ත මූලාශ්‍රය: වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රේගු ආනයන බදු පැනවී ඇති සං.වි.සංකේතාංක වල – ප්‍රතිවර්තනය සහ ගැලපුම්



- සංශෝධනය නොවූ රේගු ආනයන බදු අනුප්‍රමාණයන්ට යටත්වන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සංඛ්‍යාවේ ප්‍රතිශතය
- සංශෝධනය වූ රේගු ආනයන බදු අනුප්‍රමාණයන්ට යටත්වන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සංඛ්‍යාවේ ප්‍රතිශතය

දත්ත මූලාශ්‍රය: වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

කාණ්ඩ 4 කින් යුතු රේගු ආනයන බදු ව්‍යුහය යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය වන ආකාරය

BEC Rev.5ට අනුකූලව රේගු ආනයන බදු කාණ්ඩය	රේගු ආනයන බදු අනුප්‍රමාණය	ආවරණය වන ක්ෂේත්‍ර	ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩ
ප්‍රාථමික භාණ්ඩ සහ අතරමැදි භාණ්ඩ	0%	කෘෂිකර්ම, නිෂ්පාදන, ඉදිකිරීම්, සේවා අංශ ආදිය	කෘෂිකාර්මික යෙදවුම්, ආහාර සහ කෘෂි-කර්මාන්ත යෙදවුම්, සගන්ධ තෙල්, රසායනික ද්‍රව්‍ය, ඛනිජ ද්‍රව්‍ය, ප්ලාස්ටික් සහ රබර්, හම්, දැව, ලෝහ, වීදුරු, යන්ත්‍රෝපකරණ, විදුලි උපකරණ, නිරවද්‍යතාවය මැනීමේ උපකරණ ආදිය
	10%		
පාරිභෝජන භාණ්ඩ	20%	පිරිසැකසුම්කළ ආහාර, ගෘහස්ත උපකරණ, සංගීත භාණ්ඩ ආදිය	කිරි ආශ්‍රිත නිෂ්පාදන, පිරිසැකසුම් කළ ආහාර, ගෘහස්ත උපකරණ, රෙදිපිළි, ක්‍රීඩා උපකරණ, සංගීත භාණ්ඩ, කලාත්මක භාණ්ඩ, ඓතිහාසික වැදගත්කමකින් යුතු වටිනා භාණ්ඩ හා කෞතුක භාණ්ඩ, තෝරාගත් නියාමිත භාණ්ඩ ආදිය.
සුඛෝපභෝගී භාණ්ඩ ඇතුළුව පාරිභෝජන භාණ්ඩ	30%	ජීවන චර්යා අනුව භාවිතා කරන භාණ්ඩ, සෙල්ලම් බඩු, ප්‍රවාහන ආදිය	පුද්ගලික සනීපාරක්ෂක භාණ්ඩ අයිතම, මෝටර් වාහන, ඔරලෝසු, සෙල්ලම් භාණ්ඩ, අව් කණ්ණාඩි ආදිය.

5. සුරක්ෂිතතාවය සඳහා සිදුකර ඇති සැලසුම්

බාධාවලින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා, පහත පියවර අනුගමනය කරනු ලැබේ:

- රජයේ ආදායම් සුරක්ෂිත කිරීම සඳහා තෝරාගත් අතරමැදි භාණ්ඩ සඳහා අදාළ වන රේගු ආනයන බදුඅනුප්‍රමාණය සියයට 20 කාණ්ඩයේ තාවකාලික වශයෙන් රඳවා ගනු ලැබේ.
- නිශ්චිත අනුප්‍රමාණයන් නොවෙනස්ව පවතී.
- රේගු ආනයන බද්දෙන් නිදහස් භාණ්ඩ කාණ්ඩයට ඇතුළත්වන භාණ්ඩ නොවෙනස්ව පවතී.
- දුම්කොළ සහ මධ්‍යසාර මෙම ක්‍රමවේදයෙන් ඉවත් කර තිබේ.
- ක්ෂේත්‍රවල පවතින අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් ඉලක්කගත ගැලපුම් සිදුකිරීම.

කාණ්ඩ 4 ක් යටතේ පවතින බදු ව්‍යුහයක් සහිතව රේගු ආනයන බද්ද සංස්කරණය සම්බන්ධිතයි...

කාණ්ඩ 4 කින් යුතු රේගු ආනයන බදු ව්‍යුහය යටතේ ප්‍රධාන බදු ගැලපුම්

කාණ්ඩ 4 කින් යුතු රේගු ආනයන බදු අනුප්‍රමාණ යටතේ පහත දැක්වෙන ප්‍රධාන ගැලපුම් හඳුන්වා දී තිබේ:

(අ) අතරමැදි භාණ්ඩ මත පැනවී ඇති රේගු ආනයන බදු අඩු කිරීම

මීට පෙර සියයට 15ක් වූ රේගු ආනයන බදු අනුප්‍රමාණයකට යටත්ව තිබූ අතරමැදි භාණ්ඩ සඳහා වූ රේගු ආනයන බදු අනුප්‍රමාණය, යෙදවුම් පිරිවැය අඩු කිරීමට සහ කාර්මික තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම පිණිස සියයට 10 දක්වා අඩු කර තිබේ.

(ආ) පාරිභෝජන භාණ්ඩ මත වූ රේගු ආනයන බදු තාර්කිකරණය

අත්‍යවශ්‍යතාවය සහ දේශීය නිෂ්පාදන සැලකිල්ලට ගෙන පාරිභෝජන භාණ්ඩ සියයට 20 හෝ සියයට 30 අනුප්‍රමාණවල අලුතෙන් සකස් කර තිබේ.

(ඇ) තෝරාගත් භාණ්ඩ සියයට 20 අනුප්‍රමාණය මත රඳවා ඇත.

ආදායම් බලපෑම් සහ අදාළ ක්ෂේත්‍රවලට නිශ්චිත වූ අවධානීත කරුණු සැලකිල්ලට ගෙන, ඇතැම් අතරමැදි භාණ්ඩ තාවකාලික වශයෙන් සියයට 20 අනුප්‍රමාණය මත රඳවා තිබේ.

(ඈ) මිශ්‍ර බදු අනුප්‍රමාණ ව්‍යුහයන් ක්‍රමානුකූලව සංවිධිත කිරීම

සංශෝධිත රේගු ආනයන බදු කාණ්ඩවලට අනුකූලව මිශ්‍ර අනුප්‍රමාණ තාර්කිකරණය කර ගැලපුම් කර තිබේ.

(ඉ) සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ඔස්සේ ස්ථායිතාවය පවත්වා ගැනීම

අඛණ්ඩතාවය සහ ආයෝජක විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහා බහුතරයක් වූ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක මත බදු අනුප්‍රමාණ නොවෙනස්ව පවතී.

(ඊ) ක්ෂේත්‍රවලට නිශ්චිත වූ ගැලපුම්

නිෂ්පාදන කාර්යය සඳහා සහාය, ආදායම් බලගැන්වීම, සහ පාරිභෝගිකයන්ගේ අවධානීත කරුණු අතර සමබරතාවය සඳහා තෝරාගත් ක්ෂේත්‍රවලට ඉලක්කගත ගැලපුම් සිදුකර තිබේ.

(උ) කාණ්ඩ 4 කින් යුතු රේගු ආනයන බදු ව්‍යුහය තුලින් බැහැරවීම

ආදායම් ස්ථාවර වශයෙන් පවත්වා ගැනීම සහ ප්‍රතිපත්තිමය අරමුණු මත පදනම්ව නිශ්චිත අනුප්‍රමාණවලට යටත් භාණ්ඩ මෙන්ම දුම්කොළ සහ මධ්‍යසාර නිෂ්පාදන ද මෙම රාමුවෙන් බැහැර කර ඇත.

6. රාජ්‍ය මූල්‍ය මත බලපෑම

ශ්‍රී ලංකා රේගුවෙන් ලබාගත් 2024 සහ 2025 වර්ෂවල ආයාතනික ද්‍රව්‍ය ආශ්‍රිත සංඛ්‍යාලේඛන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ දළ දේශීය නිෂ්පාදිත දත්ත මත සිදුකළ ගණනය කිරීම් මත පදනම්ව, රාජ්‍ය ආදායම් මත ඇස්තමේන්තුගත බලපෑම වනුයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.1 කට අඩු ප්‍රමාණයකි.

7. අපේක්ෂිත ප්‍රතිඵල

මෙම සංස්කරණවලින් අපේක්ෂා කරනුයේ:

- නිෂ්පාදන පිරිවැය අඩු කිරීම ඔස්සේ කාර්මික තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම.
- ආයෝජන ආකර්ෂණීයභාවය වැඩිකිරීම.
- රේගු ආනයන බදු පරිපාලනයේ විනිවිදභාවය වැඩිකිරීම.
- අපනයන වර්ධනය සඳහා රුකුලක් සැපයීම.
- ආර්ථිකයේ නිෂ්පාදන පදනම ශක්තිමත් කිරීම.

8. සමාප්තිය

මෙම කාණ්ඩ 4 කින් යුතු රේගු ආනයන බදු සංස්කරණය ඔස්සේ භාණ්ඩ වර්ගීකරණය සහ ජාතික ආර්ථික අරමුණු සම්බන්ධිත ජාත්‍යන්තර යහපත් පරිචයන්ට අනුකූලව සංවිධිත, විනිවිදභාවයෙන් යුතු, රීති මත පදනම් රේගු ආනයන බදු රාමුවක් ස්ථාපනය කෙරේ. අතරමැදි භාණ්ඩ සහ ප්‍රාග්ධන භාණ්ඩ මත අඩු මට්ටමේ රේගු ආනයන බදු සමඟින් පාරිභෝජන භාණ්ඩ මත සියයට 20 හෝ සියයට 30 අනුප්‍රමාණයෙන් රේගු ආනයන බදු පැනවීම යොදා ගැනීම ඔස්සේ කාර්මික තරඟකාරිත්වය සඳහා රුකුලක් සැපයීම, අපනයන වර්ධනය සහ කාර්යක්ෂම සම්පත් යොදාගැනීමක් සිදුවේ. ඉලක්කගත ආරක්ෂිත පියවරවලින් රුකුලක් සපයමින් බහුතරයක් වූ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ඔස්සේ පවතින ස්ථාවරත්වය මඟින් අවම බාධා සහිත සුමට පරිවර්තනයක් සහතික කරන අතර, එමඟින් තරඟකාරී සහ ඔරොත්තු දීමේ හැකියාව සහිත ආර්ථිකයක් සඳහා වන අඩිතාලම සවිමත් කෙරේ.

වෙනත් බදු

විදුලි සංදේශ බද්ද

පරිශීලකයින් වඩාත් දැරිය හැකි පැකේජවලට මාරු වීම හේතුවෙන් සාම්ප්‍රදායික විදුලි සංදේශ සේවාවන් සම්බන්ධ පාරිභෝගික වියදම් අඩුවීම පිළිබිඹු කරමින් විදුලි සංදේශ බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 15.9 සිට 2025 වසරේ දී රු. බිලියන 15.0 දක්වා සියයට 5.0 කින් අඩු විය.

ආංශික කාර්යසාධනය සැලකූ විට, සාම්ප්‍රදායික ස්ථාවර දුරකථන සේවා මත රඳා පැවතීමේ අඛණ්ඩ අඩුවීමක් පිළිඹිබු කරමින් ස්ථාවර සේවා සම්බන්ධතා සංඛ්‍යාව 2024 වසරේ දී වූ මිලියන 3.4 සිට 2025 වසරේදී මිලියන 2.6 දක්වා අඩු වූ අතර ස්ථාවර අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයින් සංඛ්‍යාව 2024 වසරේ දී වූ මිලියන 2.5 සිට 2025 වසරේ දී මිලියන 1.9 දක්වා අඩු විය. එසේ වුවද, ජංගම දුරකථන සබඳතාවන්හි අඛණ්ඩ ව්‍යාප්තිය පෙන්නුම් කරමින්, ජංගම දුරකථන ග්‍රාහකයින් සංඛ්‍යාව 2024 වසරේ දී වූ මිලියන 28.8 සිට 2025 දී ආසන්න වශයෙන් මිලියන 29.5 දක්වා වැඩි වූ අතර, ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් ග්‍රාහකයින් සංඛ්‍යාව 2024 වසරේ දී මිලියන 20.6 සිට 2025 වසරේ දී මිලියන 21.9 දක්වා වැඩි විය.

අපගමන බද්ද

සංචාරක පැමිණීම් 2024 වසරේ දී වූ පුද්ගලයින් 2,053,465 සිට 2025 වසරේ දී පුද්ගලයින් 2,362,521 දක්වා සියයට 15.1 කින් ඉහළ යාමෙන් සිදු වූ ශක්තිමත් වර්ධනය හේතුවෙන්, අපගමන බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 38.3 සිට 2025 වසරේ දී රු. බිලියන 53.5 දක්වා සියයට 39.6 කින් වර්ධනය විය.

ඔට්ටු ඇල්ලීම සහ සූදු බද්ද

වසර තුළදී ජාත්‍යන්තර කැසිනෝ ව්‍යාපාර කිහිපයක් වෙළඳපොළට ප්‍රවේශ වීමත් සමඟ විනෝදාස්වාද ක්‍රියාකාරකම් පුළුල් වීම පිළිබිඹු කරමින්, ඔට්ටු ඇල්ලීම සහ සූදු බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 9.8 සිට 2025 වසරේ දී රු. බිලියන 10.2 ක් දක්වා සියයට 4.4 කින් වර්ධනය විය. සූදු හෝ බුකී ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින්ගේ වාර්ෂික බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 3.7 ක සිට 2025 වසරේ දී රු. බිලියන 3.3 ක් දක්වා සියයට 11.5 කින් අඩු වුව ද, සූදු හෝ බුකී ව්‍යාපාරයක දළ එකතු කිරීම් මත වන බදු ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 5.2 සිට 2025 වසරේ දී රු. බිලියන 6.0 දක්වා සියයට 14.6 කින් වර්ධනය විය.

බදු නොවන ආදායම

සියලුම බදු නොවන ආදායම් කාණ්ඩයන්හි වර්ධනයක් පිළිබිඹු කරමින්, බදු නොවන ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 326.3 සිට 2025 වසරේ දී රු. බිලියන 400.2 දක්වා සියයට 22.7 කින් වැඩි වූ අතර, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස 2024 වසරේ දී වූ සියයට 1.08 සිට 2025 වසරේ දී සියයට 1.22 දක්වා ප්‍රතිශතාංක 0.14 කින් වර්ධනය විය.

පොලී ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 57.8 සිට 2025 වසරේදී රු. බිලියන 72.0 දක්වා සියයට 24.7 කින් වැඩි විය. ප්‍රධාන වශයෙන් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ සහ පුළුල් ආර්ථික වර්ධනය මඟින් රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය ඉහළ යාම හේතුවෙන්, ලාභ සහ ලාභාංශ 2024 වසරේ දී වූ රු. බිලියන 41.1 සිට 2025 වසරේ දී රු. බිලියන 56.5 දක්වා සියයට 37.6 කින් වර්ධනය විය. පූර්ව වසර තුනක කාලය තුළ සංශෝධනය නොවී පැවති ගාස්තු සහ අයකිරීම් ඉහළ දැමීම හේතුවෙන් දඩ, ගාස්තු සහ අයකිරීම්වලින් ලද ආදායම 2024 වසරේදී වූ රු. බිලියන 154.7 සිට 2025 වසරේදී රු. බිලියන 180.9 දක්වා සියයට 16.9 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් රජයේ නිලධාරීන්ගේ වැටුප් වැඩිවීම් සහ සමාජ ආරක්ෂණ දායකත්ව අනුපාතිකය ඉහළ දැමීම හේතුවෙන්, සමාජ ආරක්ෂණ දායකත්වයන්ගෙන් ලද ආදායම 2024 වසරේදී රු. බිලියන 43.1 සිට 2025 වසරේදී රු. බිලියන 58.8 දක්වා සියයට 36.4 කින් වර්ධනය විය.

බදු නොවන ආදායම

'අ' තාවකාලික

රු. මිලියන

අයිතමය	2024	2025 (අ)	2024/2025 (% වෙනස)	2025 (සමස්ත බදු නොවන ආදායමේ % ලෙස)
පොලී/කුලී	64,192	79,872	24.4	20.0
ලාභ සහ ලාභාංශ	41,080	56,543	37.6	14.1
දඩ, ගාස්තු හා ගෙවීම්	154,731	180,935	16.9	45.2
සමාජ ආරක්ෂණ දායක මුදල්	43,089	58,794	36.4	14.7
අනෙකුත්	23,170	24,066	3.9	6.0
එකතුව	**326,261**	**400,210**	**22.7**	**100.0**

රු. බිලියන

අයිතමය	2024	2025 ඇස්තමේන්තුව	2025 (අ)	විචලනය සඳහා බලපෑ ප්‍රධාන හේතු
ආදායම් බදු	1,026.2	1,167.0	1,139.4	2025 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 97.6 ක් ලඟාකරගනිමින් ආදායම් බදු ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 1,026.2 සිට 2025 වසරේ දී රු. බිලියන 1,139.4 දක්වා සියයට 11.0 කින් වර්ධනය වී ඇත. මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් : - රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ඉහළයාම; - දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ව්‍යාප්ත වීම ; - 2025.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි මත්පැන්, දුම්කොළ සහ සූදු සහ ඔට්ටු ඇල්ලීමේ කර්මාන්ත සඳහා ආදායම් බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ දැමීම; - 2025.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි සේවා අපනයනය මත සියයට 15 ක ආදායම් බදු පැනවීම; - 2025.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි පොලී මත රඳවාගැනීමේ බදු අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ දැමීම; - බදු පදනම පුළුල් කිරීම සඳහා බදු පරිපාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම හේතුවෙන් 2024 වසරේ දී 1,093,134 ක් වූ ලියාපදිංචි බදු ගෙවන්නන් සංඛ්‍යාව 2025 වසරේ දී 1,302,596 දක්වා සියයට 19.2 කින් වර්ධනය වීමට දායක වීම; සහ - 2024 වසරේ දී රු.බිලියන 1.9 ක් වූ ප්‍රාග්ධන ලාභ බද්ද 2025 වසරේ දී රු.බිලියන 8.0 දක්වා සැලකියයුතු ලෙස වර්ධනය වීම. කෙසේ වුවද, 2025.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි වසරකට රු. මිලියන 1.2 ක් ව පැවති උපයන විට ගෙවීමේ බද්දට අදාළ වන බදු නිදහස් සීමාව වසරකට රු. මිලියන 1.8 දක්වා වැඩි කිරීම සහ සියයට 18 බදු ස්ථරය පුළුල් කිරීම ආදායම් බදු ආදායම සඳහා සෘණාත්මකව බලපා ඇත.
එකතුකළ අගය මත බදු	1,309.7	1,615.0	1,746.9	වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 108.2 ක් ලඟාකරගනිමින් එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 1,309.7 සිට 2025 වසරේ දී රු. බිලියන 1,746.9 දක්වා සියයට 33.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. මෙම ඉහළ කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන්: - මෝටර් රථ මත පනවා තිබූ ආනයන සීමාවන් ඉවත් කිරීම; - 2025 වසරේ දී සමස්ත ආනයන ඇ.ඩො. මිලියන 21,480 දක්වා සියයට 14.0 කින් වර්ධනය වීම; - ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහකරණය සඳහා සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය ආපසු ගෙවීමට අදාළව සිදුකළ රු. බිලියන 38 ක පමණ එක්වරක් පමණක් සිදුකරනු ලබන ගෙවීම සහ මූල්‍ය අංශයේ කාර්යසාධනය ඉහළ යාම පිළිබිඹු කරමින්, මූල්‍ය සේවා මත වූ එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2025 වසරේ දී රු. බිලියන 198 ක් දක්වා සියයට 64.7 කින් වර්ධනය වීම; - දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල්වීම; සහ - වැඩිදියුණු වූ එකතු කළ අගය මත බදු අනුකූලතාවය හේතුවෙන් 2024 වසර අවසානයේ දී 21,227 ක් වූ ලියාපදිංචි බදු ගෙවන්නන් සංඛ්‍යාව 2025 වසර අවසානයේ දී 33,187 ක් දක්වා සියයට 56.3 කින් වර්ධනය වීම බලපා ඇත.

රු. බිලියන

අයිතමය	2024	2025 ඇස්තමේන්තුව	2025 (අ)	විචලනය සඳහා බලපෑ ප්‍රධාන හේතු
නිෂ්පාදන/ සුරා බදු	598.5	841.0	1,058.7	වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 25.9 ක් ඉක්මවා යමින් නිෂ්පාදන/ සුරා බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 598.5 සිට 2025 වසරේ දී රු. බිලියන 1,058.7 දක්වා සියයට 76.9 කින් වර්ධනය වී ඇත. මෙම ශක්තිමත් කාර්යසාධනය සඳහා මූලික වශයෙන් : - 2025 වසරේ පෙබරවාරි මස සිට බලපැවැත්වෙන පරිදි සියලුම වර්ගයේ මෝටර් රථ ආනයන සඳහා පැවති ආනයන සීමා ඉවත් කිරීම හේතුවෙන් මෝටර් රථ මත වූ නිෂ්පාදන බදු ආදායම වර්ධනය වීම; - 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වාර්ෂික උද්ධමනයට ගැළපුම්ගත කරමින් ද්විවාර්ෂික ක්‍රමවේදය මත පදනම්ව මෝටර් රථ, සිගරට්, සීනි අඩංගු පාන වර්ග ආදී නිෂ්පාදන බද්දට යටත් අයිතම සඳහා වූ නිෂ්පාදන බදු අනුපාතය සියයට 5.9 කින් ඉහළ දැමීම; - 2024 වසරේ දී මෙ.ටො. මිලියන 1.2 ක් සහ මෙ.ටො. මිලියන 1.17 ක් වූ පෙට්‍රල් හා ඩීසල් ආනයන පරිමාවන් 2025 වසරේ දී පිළිවෙලින් මෙ.ටො. මිලියන 1.3ක් සහ මෙ.ටො. මිලියන 1.2 ක් දක්වා වර්ධනය වීම; - වාර්ෂික උද්ධමනයට ගැළපුම්ගත කරමින් ද්විවාර්ෂික ක්‍රමවේදය මත පදනම්ව මත්පැන් සඳහා වූ සුරා බද්ද සියයට 5.9 කින් ඉහළ දැමීම සහ සැර මත්පැන් සහ ධාන්‍ය මත්පැන් යන දෙවර්ගයේම නිෂ්පාදනය 2024 වසරේ දී වූ ලීටර් මිලියන 33.4 සිට 2025 වසරේ ලීටර් මිලියන 37.3 දක්වා සියයට 11.7 කින් වර්ධනය වීම; සහ - සීනි අඩංගු පාන වර්ග, සිගරැට්, පාම් තෙල් සහ මේද අම්ල ආදී නිෂ්පාදන බද්දට යටත් අනෙකුත් භාණ්ඩ මගින් ලද ආදායම රු. බිලියන 12.1 දක්වා සියයට 50.8 කින් වර්ධනය වීම බලපා ඇත. කෙසේවුවද, දුම්වැටි මගින් ලද ආදායම සියයට 13.2 කින් අඩු වීම නිෂ්පාදන බදු ආදායම සඳහා සෘණාත්මකව බලපා ඇත.
රේගු ආනයන බදු	111.1	240.0	275.9	වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 115.0 ක් ලඟාකර ගනිමින් රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 111.1 සිට 2025 වසරේ දී රු. බිලියන 275.9 දක්වා සියයට 148.2 කින් වර්ධනය වී ඇත. මෙම කාර්යසාධනය සඳහා මූලික වශයෙන් ; - 2025 වසරේ ජනවාරි මස 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෝටර් රථ ආනයන මත සියයට 20 ක රේගු ආනයන බද්දක් පැනවීම; - 2025 වසරේ පෙබරවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෝටර් රථ ආනයන මත සියයට 50 ක අධිභාරයක් පැනවීම සහ; - 2025 වසරේ දී ආනයන ඇ.ඩො. මිලියන 21,480 දක්වා සියයට 14.0 කින් වර්ධනය වීම බලපා ඇත.

රු. බිලියන

අයිතමය	2024	2025 ඇස්තමේන්තුව	2025 (අ)	විචලනය සඳහා බලපෑ ප්‍රධාන හේතු
වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද	170.0	185.0	180.9	වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 97.8 ක් ලඟාකරගනිමින් වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් ලද ආදායම 2025 වසරේ දී රු. බිලියන 180.9 දක්වා සියයට 6.4 කින් වර්ධනය වී ඇත. මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන්: - 2025 වසරේ දී ආනයන ඇ.ඩො. මිලියන 21,480 දක්වා සියයට 14.0 කින් වර්ධනය වීම බලපා ඇත.
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	115.2	126.0	164.6	2025 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 130.6 ක් ලඟාකරගනිමින් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම රු. බිලියන 164.6 දක්වා සියයට 42.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. මෙම ශක්තිමත් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන්: - අර්තාපල්, සහල්, ලූණු සහ ලොකු ළූණු සඳහා වූ බදු අනුපාතයන් ඉහළ දැමීම; සහ - කිරි ආශ්‍රිත නිෂ්පාදන, තෙල් සහ මේදය ඇතුළුව ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමාණය සියයට 10.5 කින් වර්ධනය වීම බලපා ඇත.
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	250.9	264.0	294.5	2025 වසරේ දී ආනයන ඇ.ඩො. මිලියන 21,480 දක්වා සියයට 14.0 කින් වර්ධනය වීම සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 111.6 ක් ලඟාකර ගනිමින් 2025 වසරේ සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම රු. බිලියන 294.5 දක්වා සියයට 17.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.
වෙනත් බදු	122.9	152.0	188.4	වෙනත් බදු මඟින් ලද ආදායම 2024 වසරේ දී වූ රු. බිලියන 122.9 සිට 2025 වසරේ දී රු. බිලියන 188.4 දක්වා සියයට 53.2 කින් වර්ධනය වී ඇත. වෙනත් බදු මඟින් ලද ආදායම 2025 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 123.9 ක් ලඟාකරගෙන ඇති අතර මේ සඳහා මූලික වශයෙන්: - ආනයන වර්ධනය වීම හේතුවෙන් සෙස් බදු මඟින් ලද ආදායම සියයට සියයට 11.4 කින් වර්ධනය වීම; - මෝටර් රථ ආනයන සඳහා පැවති සීමාවන් ලිහිල් කිරීමත් සමඟ 2024 වසරේ දී රු. බිලියන 3.0 ක් ලෙස වාර්තා වූ මෝටර් රථ මත සුඛෝපභෝගී බද්දෙන් ලද ආදායම 2025 වසරේ දී රු. බිලියන 52.1 දක්වා වර්ධනය වීම; සහ - කොටස් වෙළඳපොළ චලනයන් වර්ධනය වීම පිළිබිඹු කරමින් කොටස් ගණුදෙනු බද්ද 2024 වසරේ දී වූ රු. බිලියන 3.1 සිට 2025 වසරේ දී රු. බිලියන 7.5 දක්වා වර්ධනය වීම බලපා ඇත. කෙසේ වුවද, ස්ථාවර විදුලි සංදේශ සේවා භාවිතය අඩු වීම මෙන්ම දේශීය සහ ජාත්‍යන්තර ඇමතුම් ප්‍රමාණය අඩු වීම හේතුවෙන් විදුලි සංදේශ බද්දෙන් ලද ආදායම සියයට 5.0 කින් පහළ ගොස් ඇත.
බදු නොවන ආදායම	326.3	370.0	400.2	වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 108.2 ක් ලඟාකරගනිමින්, බදු නොවන මූලාශ්‍රවලින් ලද ආදායම 2025 වසරේ දී රු. බිලියන 400.2 දක්වා සියයට 22.7 කින් වර්ධනය වී ඇත. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය සතු ව්‍යවසායයන් මඟින් ලද ලාභ සහ ලාභාංශ, පොලී ආදායම්, කුලී, දඩ මුදල්, ගාස්තු සහ අය කිරීම් මෙන්ම සමාජ ආරක්ෂණ දායකත්ව ආදායම් ලැබීම්වලින් උපයාගත් ආදායම වර්ධනය වීම හේතු වී ඇත.
එකතුව	**4,030.8**	**4,960.0**	**5,449.4**	

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග (2025 ජනවාරි - 2026 අප්‍රේල්)

<table>
<tr><th>ක්‍රියාත්මක වන දිනය</th><th>ක්‍රියාමාර්ග</th></tr>
<tr><td colspan="2">ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන</td></tr>
<tr><td>2025.04.01</td><td>2025 අංක 2 දරන දේශීය ආදායම් බදු (සංශෝධන) පනත

(1) පුද්ගල ආදායම් බදු අනුපාත ව්‍යුහය

පුද්ගලයෙකු සඳහා ලබා දෙන පුද්ගල ආදායම් බදු සහනය, වසරකට රු. 1,800,000 / - ක් දක්වා ඉහළ නැංවීම සහ පුද්ගලයෙකු සඳහා බදු අය කළ හැකි ආදායම මත අදාළ වන බදු අනුපාත පහත පරිදි සංශෝධනය කිරීම.

<table>
<tr><th rowspan="3">ආන්තික බදු අනුපාතය (%)</th><th colspan="2">වාර්ෂික බදු අයවන ආදායම (රු. මිලි.)</th></tr>
<tr><th>පෙර පැවති බදු ස්ථර</th><th>වත්මන් බදු ස්ථර</th></tr>
<tr><th>පෙර පැවති බදු ස්ථර</th><th>වත්මන් බදු ස්ථර</th></tr>
<tr><td>0</td><td>1.2 දක්වා</td><td>1.8 දක්වා</td></tr>
<tr><td>6</td><td>1.2 -1.7</td><td>1.8 - 2.8</td></tr>
<tr><td>12</td><td>1.7 - 2.2</td><td>-</td></tr>
<tr><td>18</td><td>2.2 - 2.7</td><td>2.8 - 3.3</td></tr>
<tr><td>24</td><td>2.7 - 3.2</td><td>3.3 - 3.8</td></tr>
<tr><td>30</td><td>3.2 - 3.7</td><td>3.8 - 4.3</td></tr>
<tr><td>36</td><td>3.7 ට වැඩි</td><td>4.3 ට වැඩි</td></tr>
</table>
(2) සංස්ථාපිත ආදායම් බදු අනුපාත සංශෝධනය

(i) ඔට්ටු සහ සූදු ක්‍රීඩාව මගින් ලැබෙන ඉපයීම් සහ ලාභ මත සහ අපනයනය කිරීම සඳහා හැර නිෂ්පාදනය කර විකුණනු ලබන හෝ ආනයනය කර විකුණනු ලබන ඕනෑම මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන සඳහා ලැබෙන ඉපයීම් සහ ලාභ මත ආදායම් බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා වැඩි කිරීම.

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රයෝජනයට ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටතදී යම් තැනැත්තකු වෙත සපයනු ලබන සේවා සඳහා ගෙවීම්, විදේශ ව්‍යවහාර මුදලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී, එම සේවා සැපයීමෙන් ලැබෙන ඉපයීම් හා ලාභ මත සියයට 15ක අනුපාතයට ආදායම් බදු පැනවීම.

(iii) යම් විදේශීය මූලාශ්‍රයකින් ලැබෙන ඉපයීම් හා ලාභ විදේශීය ව්‍යවහාර මුදලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී එම විදේශීය මූලාශ්‍රයෙන් ලැබෙන ඉපයීම් සහ ලාභ මත සියයට 15ක අනුපාතයට ආදායම් බදු පැනවීම.

(3) අත්තිකාරම් ආදායම් බදු (රඳවා ගැනීමේ බදු) අනුපාතය
පොළී හෝ වට්ටම් මත අත්තිකාරම් ආදායම් බදු (රඳවා ගැනීමේ බදු) අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කිරීම.</td></tr>
<tr><td colspan="2">මුද්දර ගාස්තු - 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත</td></tr>
<tr><td>2025.04.01</td><td>2025.03.27 දිනැති අංක 2429/39 දරන ගැසට් නිවේදනය

- යම් දේපලක බද්දට හෝ කුලියට දීමට අදාල යම් සාධන පත්‍රයක් මත පනවනු ලබන මුද්දර ගාස්තුව, කල්බදු හෝ කුලී ගිවිසුමේ (කුලී සින්නක්කර ගිවිසුම් හැර) සම්පූර්ණ කාලපරිච්ඡේදය අධි මිලද ඇතුළුව ගෙවිය යුතු එකතු කල්බද්දේ හෝ කුලියෙහි, සෑම රුපියල් 1,000/- ක් හෝ ඉන් කොටසක් සඳහා, රු. 10/- සිට රු. 20/- දක්වා වැඩි කිරීම.</td></tr>
<tr><td>2026.02.24</td><td>2026.02.24 දිනැති අංක 2477/22 දරන ගැසට් නිවේදනය

- ආපදාවලින් පීඩාවට පත් පුද්ගලයින් සඳහා ආපදා සහන දීමනා මත අදාල වන මුද්දර ගාස්තු ගෙවීමේ දී, රජය විසින් ගෙවනු ලබන රු. 25,000/= ඉක්මවන ගෙවීම් සඳහා නිකුත් කරන ලද රිසිට්පත් මත අය කරන ලද රු. 25/= ක මුද්දර ගාස්තුව නිදහස් කිරීම.</td></tr>
<tr><td colspan="2">සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය - 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරි පනත</td></tr>
</table>

2025.09.03	සුදු ක්‍රීඩා නියාමන අධිකාරිය පිහිටුවීමේ විෂය පථය, (අ) සුදු ක්‍රීඩා ක්‍රියාකාරකම් නියාමනය කිරීම හා පාලනය කිරීම; (ආ) සුදු ක්‍රීඩාවලට අදාළ ආදායම් එකතු කිරීම සහතික කිරීම; (ඇ) සුදු ක්‍රීඩා පවත්වාගෙන යාමේ දී ඒවායෙහි විනිවිද භාවය සහ යහ පාලනය පිළිබඳව සහතික කිරීම; (ඈ)සුදු ක්‍රීඩා කර්මාන්තයේ අඛණ්ඩතාවය සම්බන්ධයෙන් මහජනයාගේ විශ්වාසය ප්‍රවර්ධනය කිරීම; (ඉ) සුදු ක්‍රීඩාව සාධාරණ හා විනිවිද පෙනෙන ආකාරයකින් සිදු කිරීම සහතික කිරීම.
ඔට්ටු ඇල්ලීම සහ සුදු බදු පනත - 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සුදු බදු පනත	
2025.12.17 බ.පැ. 2026.01.01	2025 අංක 25 දරන ඔට්ටු ඇල්ලීම සහ සුදු බදු (සංශෝධන) පනත - 2025 අයවැය කතාවේ යෝජනා කර ඇති පරිදි පහත සඳහන් ආදායම් පියවරයන් බලාත්මක කිරීම සඳහා 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීමේ සහ සුදු බදු පනත සංශෝධනය කරන ලදී. • දළ එකතු කිරීමේ බද්ද සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීමට; සහ • ශ්‍රී ලාංකික පුරවැසියන් මත පනවා ඇති කැසිනෝ ප්‍රවේශ බද්ද ඇමරිකානු ඩොලර් 50 සිට ඇමරිකානු ඩොලර් 100 දක්වා වැඩි කිරීම.
සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත- 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත	
2026.04.09 බ.පැ. 2026.07.01 බ.පැ. 2026.05.01	2026 අංක 10 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත 1. 2026 ජූලි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ වාර්ෂික පිරිවැටුම් සීමාව රුපියල් මිලියන 60 සිට රුපියල් මිලියන 36 දක්වා අඩු කිරීම; සහ 2. 2026 මැයි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, වාහන ආනයනය කිරීමේ දී හෝ නිෂ්පාදනය කර විකිණීමේ දී සමාජ ආරක්ෂණ දායකත්ව බදු අය කිරීම සහ, අදාළ වාහන අලෙවියෙන් පසු අවස්ථාවේදී සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කිරීම.
එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත	
2024.01.01 2025.04.11 2025.04.11 2025.04.11 බ.පැ. 2025.10.01 බ.පැ. 2025.10.01	2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත 1) 2002 අංක 14 දරන වැට් බදු පනතෙන් බදු නිදහස් කිරීම් ඉවත් කිරීමේ අනපේක්ෂිත බලපෑම වලක්වා ගැනීම, පනතේ පැහැදිලි බව පවත්වා ගැනීම හා 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් හඳුන්වා දී ඇති එකතු කළ අගය මත බදු ප්‍රතිසංස්කරණ වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම. 2) භාණ්ඩ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කර ඇති බව හෝ ආනයනකරු/ අපනයනකරු එකතු කළ අගය මත බදු ලියාපදිංචි සීමාවට පහළින් සිටින බව නොසලකා, වාණිජමය අරමුණින් ආනයන/ අපනයන සිදු කරන විට, ස්ථිර වැට් බදු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම. 3) එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලද සැපයුම් /මිලදී ගැනීම් සම්බන්ධයෙන් එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් උපදෙස් නිකුත් කිරීම. 4) දේශීයව නිපදවන දියර කිරි සහ යෝගට් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම. 5) 2025 ඔක්තෝබර් මස 01 දින සිට නිර්වාසික තැනැත්තකු විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සිදුකරන සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බදු පැනවීම. 6) සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමය 2025 ඔක්තෝබර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර, මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවදානම මත පදනම් වූ ආපසු ගෙවීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම.
2025.10.31	2025.10.31 දිනැති අංක 2460/44 දරන ගැසට් නිවේදනය - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 71 වන වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ අරමුදල කළමනාකරණය කිරීම සඳහා කරනු ලබන නියෝග සැකසීම.
2025.11.07	2025.11.07 දිනැති අංක 2461/43 දරන ගැසට් නිවේදනය - ආනයනික අනගි මැණික් ගල් සහ අර්ධ අනගි මැණික් ගල් සඳහා ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද සඳහා වටිනාකම තීරණය කිරීම සඳහා බර මත පදනම් වූ තක්සේරු ක්‍රමයක් ස්ථාපිත කිරීම.
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/07 දරන ගැසට් නිවේදනය - ආනයනික රෙදි මත වන ශුන්‍ය එකතු කල අගය මත බදු අනුපාතය ඉවත් කර සම්මත එකතු කල අගය මත බදු අනුපාතය අදාළ කිරීම.

නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත	
2025.01.11	2025.01.10 දිනැති අංක 2418/43 දරන ගැසට් නිවේදනය - වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශක මත පදනම්ව ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අයකළ හැකි සියලුම භාණ්ඩ වල බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.
2025.02.01	2025.01.31 දිනැති අංක 2421/42 දරන ගැසට් නිවේදනය - විදුලි වාහන සඳහා වන නිෂ්පාදන බද්ද වැඩි කිරීම.
2025.04.29	2025.04.28 දිනැති අංක 2434/04 දරන ගැසට් නිවේදනය - බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා නිෂ්පාදන බද්ද පැනවීම.
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/06 දරන ගැසට් නිවේදනය - අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා දැනට අදාළ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය/උප බෙදීමට (NSDs) බලපැවැත්වෙන අනුපාත පදනම් කරගෙන නිෂ්පාදන බද්ද පැනවීම.
සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)	
2025.01.11	සුරාබදු නිවේදන අංක 01/2025 (2025.01.10 දිනැති අංක 2418/42 දරන ගැසට් නිවේදනය) - වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශක මත පදනම්ව මත්පැන් මත සුරා බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.
2025.10.28	සුරාබදු නිවේදන අංක 02/2025 (2025.10.27 දිනැති අංක 2460/02 දරන ගැසට් නිවේදනය) - මත්පැන් නිෂ්පාදන මත සුරා බදු ගෙවීමේ කාල සීමාව අඩු කිරීම.
2025.12.12	සුරාබදු නිවේදන අංක 03/2025 (2025.12.11 දිනැති අංක 2466/22 දරන ගැසට් නිවේදනය) - වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තුව සහ ආරක්ෂිත ඇප තැන්පතු මුදල සංශෝධනය කිරීම සහ කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් අයකරනු ලබන ගාස්තුවක් පැනවීම.
දුම්කොළ බද්ද - 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත	
2025.04.02	2025.04.01 දිනැති අංක 2430/16 දරන ගැසට් නිවේදනය - බීඩි සඳහා අදාළ වන දුම්කොළ බද්ද ඒකකයට රු. 2/- සිට රු. 3/- දක්වා වැඩි කිරීම.
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද- 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත	
2025.11.08	2025.11.07 දිනැති අංක 2461/44 දරන ගැසට් නිවේදනය - අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදීම් (NSDs) සඳහා දැනට පවතින වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු නිදහස් කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම.
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/05 දරන ගැසට් නිවේදනය - අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා, දැනට අදාළ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය/උප බෙදීමට බලපැවැත්වෙන අනුපාත පදනම් කරගෙන වරාය සහ ගුවන් තොටුලල සංවර්ධන බදු පැනවීම.
සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත	
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/04 දරන ගැසට් නිවේදනය - අලුතින් නිර්මාණය කරන ලද හෝ සංශෝධිත නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක සඳහා වන සෙස් බද්ද පැනවීම.
2026.04.01	2026.03.10 දිනැති අංක 2479/38 දරන ගැසට් නිවේදනය - 2026 අයවැය කතාවේ යෝජනා පරිදි ආනයනික රෙදි මත වන සෙස් බද්ද ඉවත් කිරීම - සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුමට අනුකූලව අතරමැදි යෙදවුම් සඳහා සෙස් අනුපාතය සියයට 50 කින් අඩු කිරීම.
සෙස් බද්ද - 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත	
2025.08.01	2025.07.02 දිනැති අංක 2443/49 දරන ගැසට් නිවේදනය - ලැයිස්තුගත ඉහළ ප්‍රතිලාභයක් සහිත සාංගමික ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් අදාළ වන ගණුදෙනු සඳහා 0.006% ක සෙස් බද්දක් පැනවීම හා සාංගමික ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් අදාළ වන ගණුදෙනු වල මුළු වටිනාකම 0.01% න් වැඩි කිරීමෙන් ලැබෙන වටිනාකම, 3 න් බෙදීමෙන් ලැබෙන අගය මත වන සෙස් බද්ද සංශෝධනය කිරීම.
රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත	
2025.01.28	ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2025 (2025.01.27 දිනැති අංක 2421/05 දරන ගැසට් නිවේදනය) - මෝටර් රථ ආනයනය සඳහා සියයට 20 හෝ සියයට 20 ක නිශ්චිත තීරු බදු අනුපාතයක් සමඟ (මිශ්‍ර තීරු බදු අනුපාතය) රේගු ආනයන බද්දක් පැනවීම.
2025.04.29	ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2025 (2025.04.28 දිනැති අංක 2434/02 දරන ගැසට් නිවේදනය) - බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා නව ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක නිර්මාණය කිරීම.
2025.10.10	ආදායම් සංරක්ෂණ ආඥා අංක 03/2025 (2025.10.09 දිනැති අංක 2457/06 දරන ගැසට් නිවේදනය) - වෙළඳපොළේ පවතින පොල්තෙල් මිල සැලකිල්ලට ගනිමින්, සහල් නිවුඩු තෙල් (Rice Bran Oil) වෙනුවෙන් නව ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක නිර්මාණය කිරීම.

2025.11.08	ආදායම් සංරක්ෂණ ආඥා අංක 04/2025 (2025.11.07 දිනැති අංක 2461/40 දරන ගැසට් නිවේදනය) - අනගි මැණික් ගල් සහ අර්ධ අනගි මැණික් ගල් ආනයනය කිරීමේදී එකතු කළ අගය මත බදු අයකිරීමේ කටයුතු සඳහා බර මත පදනම් වූ වටිනාකම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සහතික කරනු පිණිස නව ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක නිර්මාණය කිරීම.
2025.11.26	ආදායම් සංරක්ෂණ ආඥා අංක 05/2025 (2025.11.25 දිනැති අංක 2464/15 දරන ගැසට් නිවේදනය) - ශ්‍රී ලංකා පාකිස්ථාන නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ද්විපාර්ශ්වික වෙළඳ බැඳීම් සැළකිල්ලට ගනිමින්, මැන්ඩරින් (දෙමුහුන් ප්‍රභේදය) ආනයනය සඳහා මිශ්‍ර රේගු ආනයන බදු අනුපාතයක් හඳුන්වාදීම.
2026.04.01	ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2026 (2026.03.03 දිනැති අංක 2478/03 දරන ගැසට් නිවේදනය) - 2026 අප්‍රේල් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පවතින සියයට 0, සියයට 15 සහ සියයට 20 රේගු ආනයන තීරු බදු අනුපාත සියයට 0, සියයට 10, සියයට 20 සහ සියයට 30 දක්වා සංශෝධනය කරමින්, කාණ්ඩ හතරකින් යුත් රේගු ආනයන තීරු බදු ව්‍යුහයක් හඳුන්වා දීම.
රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය)	
2025.02.01	2025.01.31 දිනැති අංක 2421/43 දරන ගැසට් නිවේදනය - මෝටර් රථ ආනයනය සඳහා ආනයන බදු මත අධිභාරයක් පැනවීම.
2025.04.29	2025.04.28 දිනැති අංක 2434/03 දරන ගැසට් නිවේදනය - බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක සඳහා අධිභාරයෙන් සියයට 50ක් පැනවීම.
2026.02.01	2026.01.31 දිනැති අංක 2473/31 දරන ගැසට් නිවේදනය - මෝටර් රථ වාහන ආනයනය කිරීමේදී පනවා ඇති සියයට 50 ක අධිභාරය, 2026 දෙසැම්බර් මස 31 දින දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
2026.04.01	2026.03.12 දිනැති අංක 2479/55 දරන ගැසට් නිවේදනය - 2026 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රේගු ආනයන බද්ද සියයට 20 සිට සියයට 30 දක්වා වැඩි කිරීම සැළකිල්ලට ගනිමින්, මෝටර් රථ වාහන ආනයනය කිරීමේදී පනවා තිබූ සියයට 50 ක අධිභාරය ඉවත් කිරීම.
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත	
2025.01.01	2024.12.31 දිනැති අංක 2417/20 දරන ගැසට් නිවේදනය - අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු ආනයනික අයිතම 63 ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය 2025 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම.
2025.01.28	2025.01.27 දිනැති අංක 2421/03 දරන ගැසට් නිවේදනය - රාමසාන් උත්සව සමය වෙනුවෙන් රට ඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/-ක බදු සහනයක් සැලසීම.
2025.08.26	2025.08.25 දිනැති අංක 2451/10 දරන ගැසට් නිවේදනය - දේශීය අස්වනු නෙලීමේ කාලය සැලකිල්ලට ගනිමින් අර්තාපල් සහ බොම්බයි ළූණු ආනයනය කිරීම මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පිළිවෙලින් කිලෝ ග්‍රෑමයකට රු. 60/- සිට රු. 80/- ක් දක්වා සහ කිලෝ ග්‍රෑමයකට රු. 10/- සිට රු. 50/- ක් දක්වා වැඩි කිරීම.
2025.10.10	2025.10.09 දිනැති අංක 2457/05 දරන ගැසට් නිවේදනය - ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවේ නිර්දේශ මත සහල් නිවුඩු තෙල් සහ පොල් මද ආනයනය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පැනවීම.
2025.11.26	2025.11.25 දිනැති අංක 2464/14 දරන ගැසට් නිවේදනය - අර්තාපල් සහ බොම්බයි ළූණු ආනයනය මත පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය 2025 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම. - 2025 නොවැම්බර් 26 දින සිට බලපැවැත්වෙන පරිදි දෙමුහුන් මැන්ඩරින් ආනයනය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉවත් කිරීම.
2025.12.05	2025.12.04 දිනැති අංක 2465/16 දරන ගැසට් නිවේදනය - “දිට්වා සුළි කුණාටුවෙහි බලපෑමට ලක් වූ පුද්ගලයන්ට පහසුකම් සැලසීම සඳහා වන ආපදාවෙන් නැවත යථා තත්වයට පැමිණීමේ ව්‍යාපෘතිය” සඳහා ආධාර / පරිත්‍යාග ලෙස ලැබීමට නියමිත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ගෙවිය යුතු වන්නාවූ ආනයනය කරන අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉවත් කිරීම.
2026.01.01	2025.12.31 දිනැති අංක 2469/12 දරන ගැසට් නිවේදනය - ආනයනික අයිතම 62 ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය 2026 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම.
2026.04.01	2026.03.31 දිනැති අංක 2482/09 දරන ගැසට් නිවේදනය - 2026 අප්‍රේල් මස 01 දින සිට 2026 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි දේශිය පොල්තෙල් නිෂ්පාදනය සඳහා විජලනය කළ පොල් කැබලි ආනයනය කිරීමේදී සහ ඖෂධ නිෂ්පාදන කටයුතු සඳහා ලුණු ආනයනය කිරීමේදී, නිශ්චිත නියාමන අනුමැතීන්ට යටත්ව, අදාළ බද්දේ ඉතිරි කොටස නිදහස් කරමින් සහනදායී විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් ලබා දීමට අවසර දීම.

ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත	
2025.01.28	2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.01.27 දිනැති අංක 2421/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - වාණිජමය හෝ භාණ්ඩ ප්‍රවාහන කාර්යයන් සඳහා යොදා ගන්නා වාහන ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම.
2025.02.01	2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.01.31 දිනැති අංක 2421/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - පුද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා මෝටර් වාහන (කාර්, වෑන්, සපෝර්ට් යුටිලිටි වාහන ආදිය) ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම සහ උපරිම වයස් සීමාවන් ඉක්මවන මෝටර් රථ සඳහා ආනයන පාලන බලපත්‍ර(ICL) අවශ්‍යතාවය පැනවීම.
2025.03.19	2025 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.03.19 දිනැති අංක 2428/07 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - භාවිතා කළ මෝටර් රථ සඳහා අපනයන පරීක්ෂණ සහතික නිකුත් කිරීමට සියලුම රටවල් සඳහා බලයලත් පරීක්ෂකවරයෙකු ලෙස බියුරෝ වෙරිටාස් ආයතනය පත් කිරීම, සහ අපනයන රටෙහි බැංකුවේ මුද්‍රාව (2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 5 දරන රෙගුලාසිය ප්‍රකාරව අවශ්‍යවන) නොමැතිව ලැබුණු මෝටර් රථවල අපනයන පරීක්ෂණ සහතික මාර්ගගත සත්‍යාපනය හරහා නිදහස් කිරීමට බලපත්‍ර බැංකුවලට බලය පැවරීම.
2025.04.29	2025 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.04.19 දිනැති අංක 2434/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - 2023.01.01 දිනැති අංක 2312/77 දරන ඇති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටවූ අයිතම ලැයිස්තුව සමාලෝචනය කර තෝරාගත් අයිතම එම ලැයිස්තුවෙන් ඉවත් කිරීම සහ ඕනෑම රටක ලියාපදිංචි නොකළ (නවතම) විද්‍යුත් යතුරුපැදි ආනයනය කිරීම, ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම.
2025.05.05	2025 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.05.05 දිනැති අංක 2435/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් විද්‍යුත් වාහන සඳහා ප්‍රකාශයට පත් කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම්, මෝටර් වාහන ආනයනය සඳහා අදාල වන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සඳහා ඇතුලත් කිරීම.
2025.05.19	2025 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.05.19 දිනැති අංක 2437/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 2501.00 යටතේ වර්ගීකරණය කරන ලද අමු අයඩිනීකරණය නොකළ ලුණු සහ ආහාරයට ගත හැකි අයඩිනීකරණය කළ ලුණු (කුඩු කළ සහ කැට ලුණු) ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාව 2025 ජූනි 10 දක්වා ඉවත් කිරීම.
2025.08.15	2025 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.08.15 දිනැති අංක 2449/60 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල (2024.05.17 දිනැති අංක 2384/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) වලංගු කාල සීමාව 2025 සැප්තැම්බර් 30 දින දක්වා දීර්ඝ කිරීම.
2025.10.15	2025 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.10.15 දිනැති අංක 2458/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය කරන ලද කීරි සම්බා සහල් වලට සමාන වන GR 11/පොන්නි සම්බා සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාව, 2025 ඔක්තෝබර් 28 දක්වා ඉවත් කිරීම.

2025.10.24	2025 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.10.24 දිනැති අංක 2459/46 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - 2013 අප්‍රේල් මස 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2013 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 5 රෙගුලාසියට අනුකූල නොවන ලෙස ආනයනය කර ඇති මෝටර් වාහන හා සම්බන්ධ අධිකරණ කටයුත්තට අදාළව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද එකඟතා කොන්දේසි යටතේ එම වාහන ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කිරීම සඳහා අවසර ලබා දීම.
2025.12.01	2025 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි 2025.12.01 දිනැති අංක 2465/07 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - දිට්වා සුළි කුණාටුවත් සමග ඇති වූ හදිසි අපදා තත්ත්වය හමුවේ විපතට පත්වූවන්ට විවිධ විදේශීය පරිත්‍යාගශීලීන් විසින් ලබාදෙන භාණ්ඩ රේගු නිෂ්කාශනය කිරීමේදී අදාළවන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි වලින් කොන්දේසි සහිත නිදහස් කිරීම් ලබා දීම සහ 1990 සුවසැරිය පදනමේ ඍජු භාවිතය සඳහා පරිත්‍යාග ලෙස හෝ ප්‍රදාන ලෙස ලැබෙන, වායු බැලුන නොමැති, ලියාපදිංචි නොකළ (නවතම) ගිලන්රථ ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම.
2026.03.23	2026 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.03.23 දිනැති අංක 2481/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - අන්තර්ජාතික ගුවන් සේවා සපයන ශ්‍රී ලංකාවේ ගුවන් සේවා සමාගම් වෙත සංයෝජිත වර්ගීකරණ කේත 4012.13 යටතේ වර්ගීකරණය කර ඇති සහ අන්තර්ජාතිකව පිළිගත් ගුවන් සේවා අධිකාරීන් විසින් නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල වන නැවත අඩිය පිරවූ ගුවන් යානා ටයර් කොන්දේසි සහිතව ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම.
2026.03.31	2026 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.03.31 දිනැති අංක 2482/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - 2026 මාර්තු 03 දිනැති අංක 2478/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ආදායම් සංරක්ෂණ නියෝග මගින් ප්‍රකාශයට පත්කර ඇති සංයෝජිත වර්ගීකරණ කේතවල ජාතික උප බෙදීම්වලට අනුකූලව 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි යාවත්කාලීන කිරීම.
අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත	
2025.01.31	2025.01.31 දිනැති අංක 2421/30 දරන ගැසට් නිවේදනය - මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා, බදු නිදහස් කිරීමේ කාලය ජාත්‍යන්තර ගුවන් සේවාවක් මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර තුනක කාලයක් සම්පූර්ණ වන හෝ 2025.12.28 යන දෙකෙන් පළමුවෙන් එළඹෙන දිනය දක්වා දීර්ඝ කිරීම. - කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කර, ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා ඇ.ඩො. 30ක සහනදායී අනුපාතය දීර්ඝ කිරීම.
2025.12.29	2025.12.29 දිනැති අංක 2469/03 දරන ගැසට් නිවේදනය - මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙකුම සඳහා, බදු නිදහස් කිරීමේ කාලය 2025 දෙසැම්බර් මස 29 දින සිට 2026 ජූනි මස 31 දින දක්වා මාස 18 දීර්ඝ කිරීම.
ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද - 2004 අංක 11 දරන මුදල් පනත	
2025.04.01	2025.04.01 දිනැති අංක 2430/14 දරන ගැසට් නිවේදනය - පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, විශේෂිත දුරකථන අංක මත පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, දේශීය ප්‍රවේශ ගාස්තු , විදුලි සංදේශ සංවර්ධන ගාස්තු සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු සඳහා ගෙවිය යුතු වත්මන් බදු අනුපාතය 2025 ජනවාරි 01 සිට 2027 දෙසැම්බර් 31 දක්වා වසර තුනක් සඳහා දීර්ඝ කිරීම.
මෝටර්රථ සඳහා සුඛෝපභෝගී බද්ද - 2018 අංක 35 දරන මුදල් පනත	
2025.02.01	2025.01.31 දිනැති අංක 2421/41 දරන ගැසට් නිවේදනය - විදුලි මෝටර් රථ හැර, සෑම ඉන්ධන කාණ්ඩයකම මෝටර්රථ සඳහා වන සුඛෝපභෝගී බදු සීමාව රු. මිලියන 1.5 කින් සංශෝධනය කිරීම.

2025.04.29	2025.04.28 දිනැති අංක 2434/05 දරන ගැසට් නිවේදනය - බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විදුලි මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා වන සුබෝපභෝගී බද්ද පැනවීම.
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති- 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත	
2025.12.17	2025 අංක 26 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත - පහත සඳහන් ප්‍රධාන පියවරයන් බලාත්මක කිරීම සඳහා 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කරන ලදී: • ස්වාධීන ඇගයීම් යාන්ත්‍රණ හඳුන්වා දීම • අනුකූලතාවය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම • කලාපීය සම මට්ටමේ පවතින රටවල් සමඟ සමාන්තර වන පරිදි බදු සහන යෝජනා කිරීම • ආයතනික ප්‍රතිසංවිධානය • බදු ආදායම් අහිමිවීම් පිළිබඳව වාර්ෂික ඇස්තමේන්තුකරණය සහ හෙළිදරව්
2026.02.08	2026.02.08 දිනැති අංක 2474/66 දරන ගැසට් නිවේදනය - ඕනෑම ව්‍යාපෘතියක් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගැනීම සඳහා වන සුදුසුකම් ලැබීමේ නිර්ණායක ප්‍රකාශයට පත්කිරීම සහ අදාළ වන බදු නිදහස් කිරීම් සහ සහන නියම කිරීම.
කොළොඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත - 2021 අංක 11 දරන කොළොඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත	
2025.09.20	2025 අංක 01 දරන කොළොඹ වරාය නගරය රෙගුලාසි (2025.09.20 දිනැති අංක 2454/62 දරන ගැසට් නිවේදනය) - කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුල ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම.
2026.01.20	2026 අංක 1 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව(සංශෝධන) පනත - පහත සඳහන් ප්‍රධාන පියවරයන් බලාත්මක කිරීම සඳහා 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කරන ලදී: • කොළඹ වරාය නගරය ප්‍රදේශය තුළ සේවයේ නියුතු පුද්ගලයන්ගේ සේවා නියුක්ති ආදායම මත අදාලවන ආදායම් බදු නිදහස් කිරීම් ඉවත් කිරීම. • වාර්ෂිකව බදු ආදායම් අහිමිවීම ප්‍රකාශයට පත් කිරීම සහ ඇස්තමේන්තුගත කිරීම, අනිවාර්ය සංස්ථාපිත ආදායම් බදු වාර්තා ගොනු කිරීම සහ තවදුරටත් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින් කාර්ය සාධන ඉලක්ක (රැකියා, උපලබ්ධි වූ ආයෝජනය, නියම කර ඇති කාලසීමා) අධීක්ෂණය හරහා අනුකූලතාව සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම. • ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව එලදායී බැංකු අධීක්ෂණය ඇතුළු නියාමන ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම.

2.4 අභියෝග හා අනාගත ඉලක්ක

1. අඛණ්ඩ ආර්ථික ප්‍රකෘතිය සඳහා සහය දැක්වීම සඳහා පවතින සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මාවත අඛණ්ඩව පවත්වාගෙන යාම සහ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සමෘද්ධිය ලබා දෙන සහ යහපැවැත්ම වැඩි කරන සියල්ල ඇතුළත්, තිරසාර සහ ශක්තිමත් වර්ධන මාවතක් ස්ථාපිත කිරීම.

2. තිරසාර සහ ඇතුළත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම සඳහා බදු ප්‍රතිපත්ති, බදු පරිපාලනය සහ නීති සම්පාදනය ආවරණය වන පරිදි ඵලදායී මූල්‍ය ප්‍රතිසංස්කරණ සකස් කිරීම.

3. 2026 වසරේ දී සියයට 1.0 ක ප්‍රාථමික අතිරික්තයක් ළඟාකර ගැනීම තුළින් රජයේ ණය තිරසාර මට්ටමක පවත්වාගැනීම සඳහා මධ්‍යකාලීනව එම ප්‍රාථමික අතිරික්තය සියයට 2.6 ක තිරසාර මට්ටමක පවත්වාගෙන යාම.

4. බදු පරිපාලනය ශක්තිමත් කිරීම සහ ප්‍රධාන ආදායම් එකතු කිරීමේ ආයතනවල පද්ධති සහ ක්‍රියාවලි ඩිජිටල්කරණය ඇතුළු ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

5. ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ආර්ථික වර්ධනයක් සහිත තරඟකාරී, අපනයන-අභිමුඛ, හරිත සහ ඩිජිටල් ආර්ථිකයක් නිර්මාණය කිරීමට නව ප්‍රතිපත්ති අපේක්ෂා කෙරේ.

....

ආචාර්ය එම්.කේ.සී .සේනානායක
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

03

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සත්‍ය 2025 රු.	2024 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	37,184,128	38,663,788
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	9,719,176	8,205,170
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	34,844
මුළු වත්කම්		46,903,304	46,903,802
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		9,719,176	8,205,170
දේපළ පිරියත හා උපකරණ සංචිතය		37,184,128	38,663,788
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	34,844
මුළු වගකීම්		46,903,304	46,903,802

පිටු අංක…7…..සිට ..37…. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ අමුණුම් පිටු අංක …37… සිට ….44.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ගණකාධිකාරී
නම : ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම	නම : ආචාර්ය එම්.කේ.සී.සේනානායක	නම : ජේ.එම්.ටී.ලක්මිණි ජයසුන්දර
තනතුර : ලේකම්	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	තනතුර: සහකාර අධ්‍යක්ෂ (මුදල්)
දිනය : 2026.02.26	දිනය : 2026.02.26	දිනය : 2026.02.26

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

ආචාර්ය එම්.කේ.සී. සේනානායක
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

ජේ.එම්.ටී. ලක්මිණි ජයසුන්දර
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

3.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තත්‍ය 2025 රු.	තත්‍ය 2024 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		97,970,000	85,915,000	ඒසීඒ-3
-	තැන්පතු		97,438	268,894	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		5,012,199	4,039,335	ඒසීඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		103,079,637	90,223,229	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**103,079,637**	**90,223,229**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		2,942,440	79,298	
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)**		**100,137,197**	**90,143,931**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
68,200,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	61,136,571	52,509,447	
57,650,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	40,286,857	34,063,973	ඒසීඒ-2(ii)
700,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	429,672	396,997	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
126,550,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**101,853,100**	86,970,417	
	මූලධන වියදම්				
2,200,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
2,842,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,837,643	2,428,501	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
908,000	හැකියා වර්ධනය	14	906,763	541,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
5,950,000	**මුළු මූලධන වියදම් (උ)**		3,744,406	2,969,501	
	තැන්පතු ගෙවීම්		97,438	373,296	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		6,526,205	5,215,681	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**6,623,643**	**5,588,977**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		112,221,149	95,528,895	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(12,083,952)	(5,384,964)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		#REF!	5,419,807	ඒසීඒ-7
				-	ඒසීඒ-3
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	34,844	

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

		ඒසීඒ-සී
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය		
	තත්‍ය **2025** රු.	සංශෝධිත **2024** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	3,499,242	2,798,285
අග්‍රිම ලැබීම්	97,970,000	85,915,000
අත්තිකාරම් අයකර ගැනීම්	5,489,876	4,262,593
තැන්පතු ලැබීම්	97,438	268,894
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**107,056,556**	**93,244,772**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	93,181,372	83,890,883
සහනාධාර සහ මාරුකිරීම්	429,672	396,997
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම , මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	906,763	541,000
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	169,867	284,273
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	2,942,440	79,298
අත්තිකාරම් ගෙවීම්	6,526,205	5,215,681
තැන්පතු ගෙවීම්	97,438	373,296
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**104,253,757**	**90,781,428**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,802,799**	**2,463,345**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර	**2,837,643**	**2,428,501**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,837,643**	**2,428,501**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(2,837,643)**	**2,428,501**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(34,844)**	**34,844**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(34,844)**	**34,844**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**34,844**	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1. පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7. මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - (අදාළ නොවේ)

රු.

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස
1002.10.00	සමාජ වගකීම් බද්ද	-	-	-	-
2005.01.00	මහ බැංකු ලාභ	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	129,000,000	126,550,000	101,853,100	80.48%
ප්‍රාග්ධන	3,500,000	5,950,000	3,744,406	62.93%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - (අදාළ නොවේ)

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	32,784,127.52	32,784,127.52	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TPD/B/DFP/25/69/FA	ඔබේ අංකය / உமது இல. / Your No.	දිනය / திகதி / Date 2026 මැයි 2y දින

17 JUN 2026
59927

AD4/C.

ගණන්දීමේ නිලධාරී
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම

විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාල විගණන සාක්ෂි ලබාගැනීමට අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

3.1.1. හිඟ ආදායම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 128 (2) ඉ ප්‍රකාරව, රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරියකුගේ වගකීම වුවත්, 2010 වර්ෂයට පෙර සිට පැවත එන හා 2025 දෙසැම්බර් 31 දිනට වූ රු.62,783,502 ක්වූ හිඟ සමාජ වගකීම් බදු මුදලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු බදු මුදලක් අයකර ගෙන නොතිබූ අතර ඊට අදාලව සාධනීය ප්‍රතිපත්තිමය පියවරයන් ගැනීමට දෙපාර්තමේන්තුව 2026 මැයි 20 වන විටත් අපොහොසත්වී තිබුණි.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 අවශ්‍යතාවයට වඩා වැඩියෙන් ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගැනීම

(අ) අංක 238-1-1-0-1304 මෘදුකාංග නඩත්තු වැය විෂයය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.10,000,000 න් මු.රෙ. 66 මගින් රු.9,110,000ක් හෙවත් සියයට 91ක්වූ සැලකිය යුතු ප්‍රමාණයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයකට මාරු කර තිබුණි. මාරු කිරීමෙන් පසු ඉතිරි වූ ශුද්ධ ප්‍රතිපාදන වටිනාකම වූ රු.890,000 ක් හෙවත් සියයට 100 ක් ම වියදම් කිරීමෙන් තොරව ඉතිරි වී තිබුණි.

(ආ) අංක 238-1-1-0-1303 ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තු වැය විෂයය සඳහා වෙන් කරන ලද ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.200,000 වියදම් කිරීමෙන් තොරව එනම් සියයට 100 ඉතිරිවී තිබුණි. මෙම වැය විෂයය සඳහා ඉකුත් වර්ෂයේ රු.500,000 ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණ ද, රු.475,000 ක් ප්‍රතිපාදන මු.රෙ 66 මගින් වෙනත් වැය විෂයයකට මාරු කිරීමෙන් පසු ඉතිරිය වූ රු.25,000 න් රු.775 ක් පමණක් වියදම් කර තිබුණි. මේ අනුව, අවශ්‍යතාවය පිළිබඳ නිසි අධ්‍යයනයකින් තොරව ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර ගෙන නොතිබූ 238-1-1-0-2001ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැය විෂයය සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.2,200,000 ක් ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණද කිසිදු වියදමක් දැරීමෙන් තොරව මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

3.3 දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ අඩුපාඩු

භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-100 (ශේෂ පිරික්සුම) අනුව, අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම්වල ශේෂයක් නොමැති වුවත්, එම ශේෂයන්ගේ එකතුව රු.775,204 ක් වැඩියෙන්ද, දෙපාර්තමේන්තුව වෙත පැමිණි නිලධාරින්ගේ ණය ශේෂ (238-12) නිරවුල් කිරීම්වල එකතුව රු.2,852,126 ක් වුවත්, එම ශේෂය රු.2,076,922 ක් ලෙස දැක්වීමෙන් එම ශේෂය රු.775,204ක් අඩුවෙන්ද ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි දක්වා තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

2023 අගෝස්තු 24 දිනැති අංක 06/2023 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව, සියළුම රජයේ ආයතනවල පවතින වාහන සඳහා වන මොඩියුලය 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කර තිබුණි. එම චක්‍රලේඛයේ 04 (iv) ඡේදය ප්‍රකාරව, නීත්‍යානුකූල අයිතිය පිළිබඳ සැලකීමකින් තොරව, අදාළ ආයතනයෙහි පවතින සියලුම වාහන පරිශීලක අත්පොතෙහි ලබා දී ඇති උපදෙස් හා මඟපෙන්වීම් අනුව මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියෙහි (NFAMS) ඇතුළත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවට අයත් වාහන 2 ක් සහ මෙහෙයුම් කල්බදු පදනම යටතේ මිලට ගෙන තිබූ වාහන 2ක් ඇතුළු වාහන 4 කට අදාලව මූලික තොරතුරු සහ එම වාහන 4 හා තවත් වාහන 3 ක් ද ඇතුළුව වාහන 7කට අදාලව අනෙකුත් තොරතුරු (තක්සේරු වටිනාකම, රක්ෂණ අනතුරු, නඩත්තු, ඉන්ධන කාර්යක්ෂමතාව, වාහන ආයතන අතර මාරු කිරීම හා අපහරණ) යනා දී විස්තර 2025 දෙසැම්බර් 31 දින වන විටත් මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියෙහි (NFAMS) ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 බැරකම් හා බැදීම්වලට එළඹීම

මෙ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මු.රෙ.94 (I) බැරකම්වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශනයට (ඇමුණුම iii භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-92) අනුව, අංක 238-1-0-1-1402 වැය විෂයයට අදාල බැදීම් හා බැරකම්වල වටිනාකම රු.67,585 ක් බැරකම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-92 ට අනුව, අංක 238-1-1-1002 දරන වැය විෂයයේ බැදීම් හා බැරකම්වල එකතුව රු.185,942 ක් වුවත්, බැරකම් ලේඛනයට අනුව එම ශේෂය රු.165,990 ක් වීමෙන් රු.19,952 ක වෙනසක් නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2025 වර්ෂයේ අයවැයෙහි ඇතුලත් ආදායම් යෝජනා 06 ක් සම්බන්ධයෙන් එම යෝජනා ක්‍රියාත්මක කිරීමේ අරමුණු ඉටුකර ගැනීම් සඳහා පුරෝකථනය කරන ලද මූල්‍ය ප්‍රගතිය (අභිමිවන ආදායම/රැස් කරන ආදායම) පිළිබඳව 2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් අදාල ආයතන වෙතින් ලබා ගෙන නොතිබුණු බැවින් ආදායම් යෝජනා ක්‍රියාත්මක කිරීමේ අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) 2025 වර්ෂයේ ආදායම් යෝජනාවක්වූ සුනාමි ව්‍යාපෘතිවලට අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් කපා හැරීමට තීරණය කර ඇති හිඟ වැට් බදු වටිනාකම් යෝජනාව 2026 මැයි 20 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

5. අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	27	20	07
තෘතීයික මට්ටම	02	01	01
ද්විතීයික මට්ටම	28	24	04
ප්‍රාථමික මට්ටම	15	11	04
එකතුව	72	56	16

ඉහත පුරප්පාඩු තනතුරුවලින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07න් තනතුරු 4 ක් සහ ද්විතියික මට්ටමේ තනතුරු 4 න් තනතුරු 3 ක් 2023 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති අතර ප්‍රාථමික මට්ටමේ තනතුරු 4 ම 2023 වර්ෂයේ සිට පුප්පාඩුව පැවතුණි.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04

කාර්යසාධන දර්ශක

4.0 කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

නිශ්චිත දර්ශක	තත්‍ය ප්‍රතිදානය අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් ලෙස		
	100%-90%	75%-89%	50%- 74%
01. මූල්‍ය ප්‍රතිපත්තිය සහ මධ්‍යකාලීන මූල්‍ය උපාය මාර්ග සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම			
i. ආදායම් සහ වියදම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ කාර්යසාධනය නිරීක්ෂණය කිරීම	√		
ii. රටේ සාර්ව මූල්‍ය තත්ත්වය සමාලෝචනය කිරීම	√		
iii. ආර්ථික ප්‍රතිපත්ති දිශානතිය කෙරෙහි බලපෑමක් ඇති කරන අදාළ ආයතන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම	√		
iv. මාසික, ත්‍රෛමාසික සහ වාර්ෂික අයවැය ප්‍රතිපල සකස් කිරීම සහ මධ්‍යකාලීන මූල්‍ය රාමුව සකස් කිරීම	√		
02. වත්මන් මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය සමාලෝචනය කිරීම සහ සුදුසු ගැලපීම් යෝජනා කිරීම			
03. සාර්ව-මූල්‍ය පර්යේෂණ			
i. ආර්ථිකයේ ප්‍රධාන ගැටලුවලට අදාළ විශ්ලේෂණයන්හි නිරත වෙමින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය දත්ත සහ තොරතුරු සැපයීම	√		
ii. ආදායම්, වියදම් සහ මූල්‍යකරණය විශ්ලේෂණය, ආදායම් පුරෝකථනය සහ මධ්‍යකාලීන මූල්‍ය රාමුව විශ්ලේෂණය කිරීම	√		
iii. මූල්‍ය ප්‍රතිපත්ති ඉලක්ක සැකසීම සහ මූල්‍ය අවදානම් හඳුනා ගැනීම	√		
iv. විචලනයන් විශ්ලේෂණය කිරීම සහ අපගමනයන් සඳහා හේතු, නිවැරදි කිරීමේ ප්‍රතිපත්ති සහ මූල්‍ය රීති ඉදිරිපත් කිරීම	√		
v. මූල්‍ය ප්‍රතිපත්තිවල ආර්ථික හා සමාජීය බලපෑම විශ්ලේෂණය කිරීම සහ සාර්ව ආර්ථික රාමුව සකස් කිරීම	√		
vi. දත්ත විශ්ලේෂණය කිරීම සහ සංක්ෂිප්ත, සංකල්ප පත්‍රිකා හෝ විශ්ලේෂණාත්මක පත්‍රිකා ලිවීම	√		
vii. පවතින සහ යෝජිත ආදායම් උත්පාදන ප්‍රතිපත්තිවල බලපෑම පරීක්ෂා කිරීම	√		
viii. ආංශික අයවැය, මූල්‍ය ව්‍යුහයන්, වියදම් ප්‍රවණතා සහ අයවැය ඇස්තමේන්තු පරීක්ෂා කර විශ්ලේෂණය කිරීම සහ විකල්ප අයවැය ප්‍රතිපාදන විශ්ලේෂණය කිරීම	√		
ix. ණය ප්‍රතිපත්තිය විශ්ලේෂණය කිරීම - ණය කළමනාකරණ ව්‍යුහය, ණය සංඛ්‍යාලේඛන, ණය තිරසාරභාවය, රජයේ ණය කළඹ සඳහා පිරිවැය	√		

සහ අවදානම් කළමනාකරණ රාමුව සහ ව්‍යාපෘති ණය සහ ණය සේවා ගෙවීම			
x. සතිපතා ආර්ථික වාර්තාව සහ මූල්‍ය සමාලෝචන වාර්තාව සකස් කිරීම	√		
04. 2024 - 2026 සඳහා ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම			
i. එක් එක් ආදායම් උත්පාදන ආයතනයෙන් ඇස්තමේන්තු ඉල්ලා සිටීම	√		
ii. ආදායම් ඇස්තමේන්තු ඇගයීම	√		
iii. ඇස්තමේන්තු අවසන් තීරණයකට එළඹීම	√		
05. මූල්‍ය ප්‍රතිපත්ති සමාලෝචනය			
i. භාණ්ඩාගාර ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් සෑම මාසයකම පැවැත්වෙන ආදායම් කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ සමාලෝචන රැස්වීමට සහභාගී වීම	√		
ii. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව වැනි ආදායම් එකතු කරන ආයතන වෙත අවශ්‍ය ප්‍රතිපත්තිමය දායකත්වයන් ලබා දීම	√		
06. 2025 වර්ෂයේ ආදායම් කාර්යසාධනය නිරීක්ෂණය කිරීම			
i. 2025 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු වල කාර්යසාධනය නිරීක්ෂණය කිරීම	√		
ii. 2025 අයවැය මගින් හඳුන්වා දුන් ප්‍රතිපත්තිමය සහ පරිපාලනමය වෙනස්කම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම	√		
iii. අවශ්‍ය පරිදි බදු ප්‍රතිපත්ති සංශෝධනය කිරීම	√		
iv. පැහැර හරින ලද බදු විශ්ලේෂණය කිරීම සහ එවැනි පැහැර හැරීම් අවම කිරීම සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශ සකස් කිරීම	√		
07. 2026 අයවැය කතාව සකස් කිරීම			
i. අවශ්‍ය සහ අත්‍යවශ්‍ය ප්‍රතිපත්තිමය දිශාවන් අයවැය රාමුවට ඇතුළත් කිරීම	√		
ii. මහජනතාවගෙන්, පෞද්ගලික අංශයෙන් සහ රාජ්‍ය ආයතනවලින් අයවැය යෝජනා කැඳවීම	√		
iii. මහජනතාව, පෞද්ගලික අංශය සහ රාජ්‍ය ආයතනවලින් ලැබුණු අයවැය යෝජනා සාරාංශ කිරීම	√		
iv. 2024 අයවැයේ ආදායම් යෝජනා ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කිරීම	√		
v. 2026 අයවැයේ ආදායම් යෝජනා විශ්ලේෂණය කිරීම	√		
vi. ආදායම් යෝජනාවලට අදාළ ගැසට් නිවේදන සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම	√		

08. 2024 අයවැය සහ 2025 අයවැය ආදායම් යෝජනා ක්‍රියාත්මක කිරීම සහ නිරීක්ෂණය කිරීම			
i. අදාළ පනත් කෙටුම්පත් කිරීම සහ අදාළ පනත් සඳහා සංශෝධන සිදු කිරීම	√		
ii. නීති කෙටුම්පත් සම්පාදක සහ නීතිපතිවරයාගෙන් සහතික ලබා ගැනීම	√		
iii. කැබිනට් අනුමැතිය ලබා ගැනීම	√		
iv. පනත් සහ පනත් කෙටුම්පත් ප්‍රකාශයට පත් කිරීම	√		
v. අනුමැතිය සඳහා අදාළ පනත් සහ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම	√		
09. අදාළ නීතිවලට අනුකූලව විවිධ බදු නිදහස් කිරීම් සහ සහන ලබා දීම			
i. බදු මත අවශ්‍ය සංශෝධන සිදු කිරීම	√		
ii. බදු කරුණු සම්බන්ධයෙන් මහජනතාව, රාජ්‍ය සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන විසින් කරනු ලබන ඉල්ලීම් සහ නියෝජනයන් සඳහා සහභාගී වීම සහ කටයුතු කිරීම	√		
10. දෙපාර්තමේන්තුවේ පරිපාලන හා මූල්‍ය කටයුතු			
i. බදු ප්‍රතිපත්ති විශ්ලේෂණ අංශය පිහිටුවීම	√		
ii. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය සහ බඳවා ගැනීමේ කාර්ය මණ්ඩලය ලබා ගැනීම	√		
iii. ධාරිතා සංවර්ධනය	√		
11. 2024 අංක 44 දරන රාජ්‍ය මුදල් කළමනාකරණ පනත යටතේ වාර්තා සකස් කිරීම සහ එම වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම			
i. වාර්ෂික වාර්තාව	√		
ii. මධ්‍ය වසරේ මූල්‍ය තත්ත්ව වාර්තාව	√		
iii. අයවැය ආර්ථික හා මූල්‍ය තත්ත්ව වාර්තාව	√		
iv. මැතිවරණයට පෙර අයවැය තත්ත්ව වාර්තාව	√		
v. මූල්‍ය උපාය මාර්ග ප්‍රකාශන වාර්තාව	√		
vi. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ වාර්තා	√		
12. පාර්ලිමේන්තු සහ කැබිනට් මණ්ඩල කටයුතු			
i. කැබිනට් පත්‍රිකා සහ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහ අදහස් සකස් කිරීම	√		
ii. පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා නිරීක්ෂණ සකස් කිරීම	√		
iii. පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් සඳහා සහභාගී වීම	√		

05

තිරසර සංවර්ධන අරමුණු ළඟාකරගැනීමේ කාර්යසාධනය

5.0 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

අරමුණු	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	2025.12.31 දිනට ප්‍රගතිය		
			0%-49%	50% - 74%	75% - 100%
ප්‍රමාණවත් සහ පිරිසිදු බලශක්තිය	වසර 2030 වනවිට ගෝලීය බලශක්ති මිශ්‍රනයේ පුනර්ජනනීය බලශක්තියේ කොටස සැළකිය යුතු ලෙස වර්ධනය කර ගැනීම.	පුනර්ජනනීය බලශක්ති විශේෂ ව්‍යාපෘති ප්‍රදානය කරන ලද බදු නිදහස් කිරීම අඛණ්ඩව ලබා දීම.			100%
සුනිසි රැකියා සහ ආර්ථික වර්ධනය	ජාතික වශයෙන් පවතින තත්ත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය නොනැසී පවත්වා ගැනීම සහ ඌන සංවර්ධන රටවල දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය වාර්ෂිකව 7%ක අගයකවත් පවත්වාගෙන යාම.	2024 සහ 2025 වසරවල සියයට 5.5 ක ධනාත්මක ආර්ථික වර්ධනයක් වාර්තා කර ඇති අතර, 2026 පළමුවන කාර්තුවේදී ද සියයට 5 ක ධනාත්මක ආර්ථික වර්ධනයක් වාර්තා වී ඇත. පවතින මැදපෙරදිග යුධමය වාතාවරණය හමුවේ රටෙහි ආර්ථික වර්ධනය කෙරෙහි බලපෑමක් ඇතිවුවද, 2026 වසරේ දළ දේශිය නිෂ්පාදනයේ වර්ධනය 3% - 5% අතර අගයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.			100%
සාමය, යුක්තිය සහ ශක්තිමත් සංස්ථානය	සියළුම මට්ටම්වල පවතින ආයතන ඵලදායී, වගවන සහ විනිවිදභාවයකින් යුත් ආයතන බවට සංවර්ධනය කිරීම.	අංශ අනුව අනුමත අයවැයෙහි කොටසක් ලෙස ප්‍රාථමික රාජ්‍ය වියදම 2025 වර්ෂයේ දී මනා ලෙස කළමනාකරණය කිරීම.			100%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය රටෙහි ඇතැම් තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට පහත පරිදි ආයක වේ.

- **අරමුණු 7 :-** සැමට පහසුවෙන් ළඟා කර ගත හැකි විශ්වාසනීය හා නවීන බලශක්ති ලබා දීම.
- **අරමුණු 8 :-** සියල්ල අන්තර්ගත සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ සහ ඵලදායි රැකියා අවස්ථා සහ සුනිසි රැකියා ප්‍රවර්ධනය කිරීම.
- **අරමුණු 16 :-** තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියල්ල අන්තර්ගත සමාජ ප්‍රවර්ධනය කිරීම, සැම මට්ටමකම සැමට යුක්තිය සඳහා ප්‍රවේශය ලබා දීම සඳහා කාර්යක්ෂම වග වන සියල්ල අන්තර්ගත සංස්ථානයන් ගොඩ නැගීම .

06

මානව සම්පත් පැතිකඩ

6.0 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	27	20	07
තෘතීයික	02	01	01
ද්විතියික	28	24	04
ප්‍රාථමික	15	11	04
එකතුව	**72**	**56**	**16**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

මෙම දෙපාර්තමේන්තුවේ අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් තනතුරු 16 ක් පුරප්පාඩු ව පවතී. එයින් පුරප්පාඩු වූ තනතුරු හතක් (07) ජ්‍යෙෂ්ඨ කාණ්ඩයට අයත් වන අතර එය ඉතිරි නිලධාරීන්ගේ කාර්යභාරයට අහිතකර ලෙස බලපානු ඇත.

** මෙය පවතින කාර්ය මණ්ඩලය තුළ නිවැරදි ලෙස උපයෝජනය කර කළමනාකරණය කර ගන්නා ලදී.

6.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු

පුහුණු පාඨමාලාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය	වැඩසටහනේ ස්වභාවය	නිමවුම/ලබාගත් දැනුම
මධ්‍යකාලීන ණය කළමනාකරණ උපාය මාර්ග සැකසීම	02	දින 01 (පැය 08)	-	දේශිය පුහුණු	මධ්‍යකාලීන ණය කළමනාකරණ උපාය මාර්ග සැකසීම පිළිබඳ දැනුම
E-Views භාවිතයෙන් ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රායෝගික මාර්ගෝපදේශය	04	දින 15 (පැය 45)	රු. 56,000/- (එක් පුද්ගලයෙක් සඳහා) රු. 224,000/- (පුද්ගලයන් 04 දෙනෙක් සඳහා)	දේශිය පුහුණු	E-Views භාවිතයෙන් ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රායෝගික දැනුම
පුද්ගල ආයතනික ආදායම් බදු	02	දින 01 (පැය 08)	රු. 8,000/- (එක් පුද්ගලයෙක් සඳහා) රු. 16,000/- (පුද්ගලයන් දෙදෙනෙක් සඳහා)	දේශිය පුහුණු	පුද්ගල බදු අයකිරීම පිළිබඳ දැනුම
Advanced MS Excel	07	දින 02 (පැය 16)	රු. 14,000/- (එක් පුද්ගලයෙක් සඳහා) රු. 98,000/- (පුද්ගලයන් හත් දෙනෙක් සඳහා)	දේශිය පුහුණු	MS Excel මගින් සිදුකෙරෙන දත්ත විශ්ලේෂණය ඇතුළු අනෙකුත් රාජකාරි කාර්යක්ෂමව හා

					නිවැරදිව ඉටුකිරීමේ හැකියාව
ලංසු ඇගයීම	01	දින 01 (පැය 08)	රු. 14,000	දේශීය පුහුණු	ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කිරීමේ හැකියාව
ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම	03	දින 01 (පැය 08)	රු. 9,500/- (එක් පුද්ගලයෙක් සඳහා) රු. 28,500/- (පුද්ගලයන් තිදෙනෙක් සඳහා)	දේශීය පුහුණු	ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කිරීමේ හැකියාව
වැටුප් පරිවර්තන	02	දින 01 (පැය 08)	රු. 8,000/- (එක් පුද්ගලයෙක් සඳහා) රු. 16,000/- (පුද්ගලයන් දෙදෙනෙක් සඳහා)	දේශීය පුහුණු	රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය සිදුකිරීම පිළිබඳ දැනුම
සේවක ආකල්ප සහ මෘදු කුසලතා පිළිබඳ වැඩමුළුව	01	දින 01 (පැය 08)	රු. 7500.00	දේශීය පුහුණු	සේවක ආකල්ප සහ මෘදු කුසලතා වැඩිදියුණු කිරීම
වාර්ෂික තොග සත්‍යාපනය සහ නිරුපිත ද්‍රව්‍ය බැහැර කිරීම	02	දින 01 (පැය 08)	රු. 14,000/- (එක් පුද්ගලයෙක් සඳහා) රු. 28,000/- (පුද්ගලයන් දෙදෙනෙක් සඳහා)	දේශීය පුහුණු	ගබඩා තොග නිසිපරිදි පවත්වාගෙනයාම සහ අවශ්‍ය තොග බැහැරකිරීම සම්බන්ධව නිවැරදි දැනුම
වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමාව	02	වසර 01 (පැය 240)	රු. 92,000/- (එක් පුද්ගලයෙක් සඳහා) රු. 184,000/- (පුද්ගලයන් දෙදෙනෙක් සඳහා)	දේශීය පුහුණු	ලිපි සකස් කිරීම සහ දෛනික රාජකාරී කටයුතු සඳහා නිවැරදි ඉංග්‍රීසි දැනුම භාවිතය
ලංසු ඇගයීම් වැඩමුළුව	01	දින 01 (පැය 08)	රු. 9,500	දේශීය පුහුණු	ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කිරීම
ප්‍රසම්පාදන ලේඛන	01	දින 02 (පැය 16)	රු. 14,000	දේශීය පුහුණු	ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කිරීම
රජයේ වැටුප් ලේඛන පද්ධතිය	02	දින 02 (පැය 16)	රු. 15,000/- (එක් පුද්ගලයෙක් සඳහා) රු. 30,000/- (පුද්ගලයන් දෙදෙනෙක් සඳහා)	දේශීය පුහුණු	නිලධාරීන්ගේ වැටුප් සැකසීමේ කටයුතු නිවැරදිව සිදුකිරීම
ප්‍රසම්පාදන සැලසුම්කරණය	01	දින 02 (පැය 16)	රු. 14,000	දේශීය පුහුණු	ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කිරීම
විද්‍යාත්මක, සහ ආරක්ෂිත රිය පැදවීම	01	දින 01 (පැය 08)	රු. 6000	දේශීය පුහුණු	විද්‍යාත්මක සහ ආරක්ෂිත රිය පැදවීම තුළින් රියදුරන්ගේ සහ වාහන වල ආරක්ෂාව තහවුරු කිරීම

ධණාත්මක වැඩ පරිසරයක් සඳහා රියදුරන් සහ කාර්යාල සහායකයින්ගේ කුසලතා සංවර්ධනය	03	දින 01 (පැය 08)	රු. 6,500/- (එක් පුද්ගලයෙක් සඳහා) රු. 19,500/- (පුද්ගලයන් තිදෙනෙක් සඳහා)	දේශිය පුහුණු	රියදුරන් සහ කාර්යාල සහායකයින්ගේ කුසලතා සංවර්ධනය තුළින් ගුණාත්මක වැඩ පරිසරයක් ඇතිකිරීම
ආරක්ෂිත සහ විද්‍යාත්මක රිය පැදවීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	දින 01 (පැය 08)	රු. 6,500/-	දේශිය පුහුණු	විද්‍යාත්මක සහ ආරක්ෂිත රිය පැදවීම තුළින් රියදුරන්ගේ සහ වාහන වල ආරක්ෂාව තහවුරු කිරීම
රජයේ වාහන නඩත්තුව	01	දින 01 (පැය 08)	රු. 6,500/-	දේශිය පුහුණු	වාහන නිසි පරිදි නඩත්තු කිරීම තුළින් රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීම
කාර්යාල සහාය සේවාවන්හි ප්‍රායෝගික පුහුණුව	02	දින 01 (පැය 08)	රු. 12,000/- (එක් පුද්ගලයෙක් සඳහා) රු. 24,000/- (පුද්ගලයන් දෙදෙනෙක් සඳහා)	දේශිය පුහුණු	කාර්යාල සහාය සේවාවන්ට අදාළ ප්‍රායෝගික පුහුණුව
රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය සහ මානසික සුවතාවය ඉහළ නැංවීමේ වැඩසටහන	01	දින 01 (පැය 08)	-	දේශිය පුහුණු	රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය සහ මානසික සුවතාවය ඉහළ නැංවීම තුළින් වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් ලබාගැනීම
සේවාරම්භක පුහුණුව	05	දින 01 (පැය 08)	-	දේශිය පුහුණු	නවක පත්වීම්ලාභීන් සඳහා රාජ්‍ය සේවය හඳුන්වාදීම.
ලංසු ඇගයීම් වැඩමුළුව	01	දින 01 (පැය 08)	රු. 14,000/-	දේශිය පුහුණු	ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කිරීම

විදේශ පුහුණු

	නම	තනතුර	වැඩසටහන	රට	වියදම	පුහුණු/ ගමන් කාලය
01	ආචාර්ය එම්.කේ.සී. සේනානායක මයා	අධ්‍යක්ෂ ජනරාල්	Spring Meetings of the International Monetary Fund and the World Bank 2025	ඇ.එ.ජ.	රක්ෂණය - රු.6,091.45 අනියම් වියදම් - ඇ.ඩො. 400 සංයුක්ත දීමනා - ඇ.ඩො. 3710 ගුවන් ටිකට්පත් ගාස්තු - රු. 616,400.00	2025.04.19 – 2025.04.29
			10th Tokyo Fiscal Forum	ජපානය	අනියම් වියදම් - ඇ.ඩො. 160 රක්ෂණ ගාස්තු - රු. 3,293.64	2025.06.09 – 2025.06.13
			Global Conference on Reimagining Public Finance	ඇ.එ.ජ.	රක්ෂණය -රු. 4,461.72 අනියම් වියදම් - ඇ.ඩො. 240 උණුසුම් ඇඳුම් දීමනාව - ස්ටර්ලින් පවුම් 75	2025.09.27 – 2025.03.10
			Annual Meetings of the IMF and World Bank 2026	ඇ.එ.ජ.	රක්ෂණය - රු.5,320.73 අනියම් වියදම් - ඇ.ඩො. 320 සංයුක්ත දීමනා - ඇ.ඩො. 2968 ගුවන් ටිකට්පත් ගාස්තු - රු. 382,900.00	2025.10.12 – 2025.10.20
			Senior Policy Forum on Sovereign Debt Resolution Framework	කුවේට්	අනියම් වියදම් - ඇ.ඩො. 120 රක්ෂණය - රු. 2,943.25	2025.12.02 – 2025.12.06
02.	එස්.එස්. රෝෂිණී මිය	අධ්‍යක්ෂ	IMF SARTTAC Training Course on Fiscal risk Management	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,452.03	2025.03.02 – 2025.03.08
			IMF SARTTAC Training Course on Public Investment Management	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,557.59	2025.11.16 – 2025.11.22
03	ඩබ්.එම්.ඩී, විජේබණ්ඩාර මයා	අධ්‍යක්ෂ	Fourteenth High-Level Tax Conference for Asian and Pacific Countries in Tokyo	ජපානය	අනියම් වියදම් - ඇ.ඩො. 100 රක්ෂණය - රු. 2,958.00	2025.09.23 – 2025.09.26
04	ජේ.ඩී. කොටින්කඩුව මෙය	අධ්‍යක්ෂ	"Second Workshop of the OECD Project on Strenghtening and Intergrating Green, Gender and SDG Budgeting in Asia"	තායිලන්තය	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,631.50	2025.04.07 – 2025.04.12
			"Negotiation on Double Tax avoidance Agreement	ස්ලෝවැකියාව	රක්ෂණය - රු.3,631.50 වීසා ගාස්තු - රු.6,100.00	2025.04.26 – 2025.05.02

			(DTAA)with Slovak Republic in Bratislava		සංයුක්ත දීමනා - ඇ.ඩො. 1,680 ගුවන් ටිකට්පත් ගාස්තු - රු. 550,000.00 උණුසුම් ඇඳුම් දීමනාව - ස්ටර්ලින් පවුම් 75	
			Seminar on Tax Administration and Digitalization for BRI Partner Countries	චීනය	අනියම් වියදම් - ඇ.ඩො. 375 රක්ෂණය - රු. 5,638.70	2025.09.08 – 2025.09.23
05	ඩබ්.ඒ.ජේ.සී. වික්‍රමාරච්චි මිය	අධ්‍යක්ෂ	IMF SARTTAC Training Course on Fiscal Risk Management	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,452.03	2025.03.02 – 2025.03.08
			Course ST 25.23 Sovereign Risk and Debt Sustainability Framework for Market Access Countries	සිංගප්පූරුව	අනියම් වියදම් - ඇ.ඩො. 175 රක්ෂණය - රු. 3,515.93	2025.09.21 – 2025.09.27
06	ඩබ්.ටී.ඒ. පෙරේරා මිය	බදු ප්‍රතිපත්ති උපදේශක	Fundamentals of Global Minimum Tax of Pillar Two-ADB,OECD,KTC and NTS	කොරියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,485.37 වීසා ගාස්තු - රු. 12,000.00	2025.04.20 – 2025.04.26
			IMF SARTTAC Training course Climate in Macroeconomic Frameworks	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,499.27	2025.04.27 – 2025.05.03
07	කේ.එම්. කුමාරසිරි මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ	IMF SARTTAC Training course Climate in Macroeconomic Frameworks	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,248,66	2025.04.27 – 2025.05.03
			Course ST 25.23 Sovereign Risk and Debt Sustainability Framework for Market Access Countries	සිංගප්පූරුව	අනියම් වියදම් - ඇ.ඩො. 175 රක්ෂණය - රු. 3,248,86	2025.09.21 – 2025.09.27
08	එම්.එල්.බී. දිල්හාරි	නියෝජ්‍ය අධ්‍යක්ෂ	IMF SARTTAC Training Course on Fiscal risk Management	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,248,86	2025.10.12 – 2025.10.18
09	එස්. සුගන්‍යා මෙය	සහකාර අධ්‍යක්ෂ	IMF SARTTAC Training Course on Nowcasting	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 325 රක්ෂණය - රු. 4,203.37	2025.02.16 – 2025.03.01
			IMF SARTTAC Training Course on Fiscal risk Management	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,248.86	2025.10.12 – 2025.10.18
10	ටී.පී, කොඩිප්පිලි මයා	සහකාර අධ්‍යක්ෂ	ITEC: Customized Course on Taxation	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 325 රක්ෂණය - රු. 4,203.37	2025.01.12 – 2025.01.25
			Seminar on "IT Based Taxation	චීනය	අනියම් වියදම් - ඇ.ඩො. 375	2025.06.30 – 2025.07.16

			Statistics Management For Officials of Developing Countries"		රක්ෂණය - රු. 4,680.86	
			IMF SARTTAC Training Course on Maroeconomic Diagnostics	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 325 රක්ෂණය - රු. 4,203.37	2025.11.30 – 2025.12.13
11	පී.එස්. කුමාරගුරු මෙය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	"Construction and Management of Development Zone for SriLanka "	චීනය	අනියම් වියදම් - ඇ.ඩො. 375 රක්ෂණය - රු. 4,680.86 උණුසුම් ඇඳුම් දීමනාව - ස්ටර්ලින් පවුම් 75	2025.04.27 – 2025.05.13
			IMF SARTTAC Training Course on Maroeconomic Diagnostics	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 325 රක්ෂණය - රු. 4,203.37 වීසා ගාස්තු - රු. 8,164.79	2025.11.30 – 2025.12.13
12	ඩී.එම්.එස්. කුමාරි මෙය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	IMF SARTTAC Training Course on Fiscal risk Management	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,248.86	2025.03.02 – 2025.03.08
			IMF SARTTAC Training Course on Maroeconomic Diagnostics	සිංගප්පූරුව	අනියම් වියදම් - ඇ.ඩො. 325 රක්ෂණය - රු. 4,203.37	2025.11.30 – 2025.12.13
			Course ST 25.23 Sovereign Risk and Debt Sustainability Framework for Market Access Countries	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,248.87	2025.09.21 – 2025.09.07
13	ජී.අයි. කුරුවිටබණ්ඩාර මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	IMF SARTTAC Training Course on Macroeconomics of Climate Change	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 325 රක්ෂණය - රු. 4,203.37	2025.09.14 – 2025.09.27
14	ජේ.ජී.ඩී. තාරකා මෙය	සහකාර අධ්‍යක්ෂ	IMF SARTTAC Training Course on Nowcasting	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 325 රක්ෂණය - රු. 4,203.37 වීසා ගාස්තු - රු. 7,406.00	2025.02.16 – 2025.03.01
			IMF CICCD Training Course on Macro-econometric Forecasting and Analysis(MFA)	චීනය	අනියම් වියදම් - ඇ.ඩො. 350 රක්ෂණය - රු. 4,680.86 වීසා ගාස්තු - රු. 5,850.00	2025.09.13 – 2025.09.27
			IMF SARTTAC Training Course on Maroeconomic Diagnostics	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 325 රක්ෂණය - රු. 4,203.37	2025.11.30 – 2025.12.13
15	ටී.එම්.කේ.ඩබ්. විතානගේ මිය	සහකාර අධ්‍යක්ෂ	Seminar on Public Financial Management for Srilanka	චීනය	අනියම් වියදම් - ඇ.ඩො. 375 රක්ෂණය - රු. 4,680.86	2025.11.03 – 2025.11.20

					උණුසුම් ඇඳුම් දීමනාව - ස්ටර්ලින් පවුම් 75	
16	ර්.එම්.කේ.ජී.කේ.එම්. ඒකනායක මයා	සංවර්ධන නිලධාරී	IMF SARTTAC Training Course on Maroeconomic Diagnostics	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 325 රක්ෂණය - රු. 4,203.37	2025.11.30 – 2025.12.13
17	එම්.ඩබ්.එන්.අයි. කුලරත්න මෙය	සංවර්ධන නිලධාරී	IMF SARTTAC Training course on Climate in Macroeconomic Frameworks	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 150 රක්ෂණය - රු. 3,248.86	2025.04.27 – 2025.05.03
			Seminar on Public Financial Management for Srilanka	චීනය	අනියම් වියදම් - ඇ.ඩො. 375 රක්ෂණය - රු. 4,680.86 උණුසුම් ඇඳුම් දීමනාව - ස්ටර්ලින් පවුම් 75	2025.11.03 – 2025.11.20
18	ජී.ඒ.එච්.බී. ගමගෙදර	සංවර්ධන නිලධාරී	IMF SARTTAC Training Course on Macroeconomics of Climate Change	ඉන්දියාව	අනියම් වියදම් - ඇ.ඩො. 325 රක්ෂණය - රු. 4,148.00 වීසා ගාස්තු - රු. 4,885.48	2025.09.14 – 2025.09.27

07

අනුකූලතා වාර්තාව

7.0 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)		අදාළ නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්		අදාළ නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ **		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

** රා.ප.ච. 02/2018 (I) අනුව මෙය සිදුකිරීම අවශ්‍ය නොවන බව දක්වා ඇත.